THE

වයිට් හැකල්

# WHITE HACKLE

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

## GALLANTRY EMITS RESPECT



# EDITORS



**COLONEL OF THE REGIMENT**
Maj Gen KADA Karunasekara RWP RSP VSV USP ndu psc



**CENTRE COMMANDANT**
Brig MM Kithsiri RWP RSP USP



**DEPUTY CENTRE COMMANDANT**
Col GMN Perera RWP RSP



**ADJUTANT RHQ SLLI**
Maj NIPK Gamage RSP psc SLLI


**CHIEF CONSULTANT**

Maj Gen KADA Karunasekara RWP RSP VSV USP ndu psc

**EDITOR IN CHIEF**

Brig MM Kithsiri RWP RSP USP

**ASSISTANT EDITORS**

Maj NIPK Gamage RSP psc SLLI ( Adjutant RHQ SLLI )

Maj TMAN Thennakoon RWP SLLI (White Hackle Publication)

Maj BABR Perera SLLI (Officer in Charge )

**HONOURARY CONSULTANTS**

Gen RMD Ratnayake (retd) WWV RWP RSP VSV USP ndu psc

Lt Gen HV Athukorale (retd) VSV psc FBIM

Brig AVR Abesinghe (retd) KSV

**COMPUTER TYPE SETTING & DESIGNING**

L/Cpl Suranga RBP - White Hackle Publication

**PHOTOGRAPHERS**

Cpl Mahindasena AGMR

Cpl Pathmasiri UDN

L/Cpl Iranga HADS



THE WHITE HACKLE
JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY
90TH ISSUE - OCTOBER -DECEMBER 2016


කතුවැකිය

## දොළොස් මසක් ගතවී යන මොහොතේ...

"කාලය රන් හා සමාන" යැයි ඇති පැරණි කියමන සනාථ කරමින් අපගේ ජීවිතයේ තවත් වසරක අවසානය සනිටුහන් වී ඇත. අප ජීවත්ව සිටින කාලය තුල බොහෝ වටිනාකමින් යුතු දේ අප ජිවිතය තුලින් ගිලිහෙන ලෙසම කාලය ද එසේම ගෙවී යයි. එසේම සියල්ල විසඳීමට කාලයට ඉඩදී බලා සිටියහොත් බොහෝ දුරට අපට සිදුවන්නේ පරාජය භාර ගැනිමටයි.

සියල්ල කාලයට භාර නොදී වටිනා කාලය උපරිම ප්‍රයෝජනයට ගැනීම තුලින් ශ්‍රී ලංකා පාබල හමුදාව පසුගිය දොළොස් මසක කාලය තුල ලබාගත් ජයග්‍රහණ බොහෝමයක් වන අතර ක්‍රීඩා ජයග්‍රහණ, එතෙර මෙතෙර පාඨමාලා ජයග්‍රහණ, ඉදිකිරීම් හා සංවර්ධනය කටයුතු, සේවා වනිතා ව්‍යපෘති හා සරඹ ජයග්‍රහණ අප රෙජිමේන්තුව ලද සුවිශේෂී ජයග්‍රහණ වේ. මෙම ජයග්‍රහණයන් කාලය සමග තරඟ කරමින් මහත් පරිශ්‍රමයක් දරා කරන ලද කැපවීම් හරහා ලබාගත් සුවිශේෂී ජයග්‍රහණ බව සඳහන් කරනු කැමැත්තෙමි.

පාබල හමුදා සෙබලුන් වශයෙන් 2016 වර්ෂය තුල ලැබූ ජයග්‍රහණ වලින් ලබාගත් ධෛර්යයෙන් හා පරාජය තුලින් ලබාගත් පන්නරය සමගින් එළඹෙන 2017 නව වසර තුල පැමිණෙන සියලු අභියෝගයන්ට සාර්ථකව මුහුණ දී විශිෂ්ඨ ජයග්‍රහණ රාශියක් ලබාගැනීමට ගතට වීර්ය ගෙන සිතින් අධිෂ්ඨාන කර ගනිමින් කටයුතු කරමු.

## READERS PLEASE WRITE IN

The **WHITE HACKLE** the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 90th issue. This quarterly is for members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals to be achieved. The success of **"THE WHITE HACKLE"** depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil and English). What is valued is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through **" THE WHITE HACKLE "**, the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience, go ahead and write into **" THE WHITE HACKLE "** we are willing to accept and publish. We are happy to hear you and consider your contribution in any form; sketches, cartoons, stories, poems and whatever comes from your thoughts and your pen.

Our Motto is **" Ich Dien", " I Serve"**. Let **" THE WHITE HACKLE "** be a way to serve each other, our Regiment and our country with our banner flying high as it always will. Wishing you all the very best.

-Editor-

# මෙවර කලාපයෙන්

ඔක්තෝබර් - දෙසැම්බර් 2016

# WHITE HACKLE

**Top Five**

## රෙජි ශ්‍රීලපාහ පුවත්


02 සුභ මොහොතින් නව තනතුරුවලට පත් වූ නිලධාරීන් සහ සෙසුනිලයින්

03 කොරියානු ආරක්ෂක විශ්ව විද්‍යාල ප්‍රධානීගේ රෙජි ශ්‍රීලපාහ සංචාරය

04 රණවිරු සැමරුම් උළෙල

08 ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 27 වැනි සංවත්සරය

10 වීර ක්‍රියා පදක්කම් පැළඳවීමේ උත්සවය

12 පාබල මේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය

15 නිලධාරී සුහද හමුව


## සේවා වනිතා පුවත්


16 අභිමංසල - පාන්ගොල්ල චාරිකාව හා සුභ සාධක වැඩසටහන්


## ක්‍රීඩා පුවත්


19 19 වැනි යුද්ධ හමුදා පැරා ක්‍රීඩා තරඟාවලියේ ජයග්‍රාහකයෝ


## විශේෂාංග


20 කණ්ඩුල සබැඳි ඉංග්‍රීසි පුවත්පත් ලිපිය

23 සිගරට් බීම නවත්වන්න ඔබත් කැමති ද ?

24 සිතක සේයා


## බළඇණි පුවත්


25 රෙජිමේන්තු අධිපති තුමන්ගේ 1 ශ්‍රීලපාහ සංචාරය

27 වසර 15ක් පුරන් වූ කෙතට ජීවය දුන් 4 ශ්‍රීලපාහ

28 29 වන බළඇණි සංවත්සරය සැමරූ 5 (සේවා) ශ්‍රීලපාහ

29 7 ශ්‍රීලපාහ පැසිපන්දු ක්‍රීඩාගාරය රෙජිමේන්තු අධිපති සුරතින් විවෘත වෙයි

32 ඉන්දියාවේ පැවති කණිෂ්ඨ සංග්‍රාමික නායකත්ව පාඨමාලාවේ දක්ෂතම ශිෂ්‍යයා 8 ශ්‍රීලපාහ ඒකකය තුලින් බිහිවෙයි

33 9(සේවා) ශ්‍රීලපාහ තම 23 වන සංවත්සරය සමරයි

34 12 ශ්‍රීලපාහ 9 වන සංවත්සරය අභිමානයෙන් සමරයි

35 15 ශ්‍රීලපාහ නව අණදෙන නිලධාරීගේ සම්ප්‍රාප්තිය

36 7 වන ජන්ම දිනය සැමරූ 24 ශ්‍රීලපාහ

37 26 ශ්‍රීලපාහ නව අණදෙන නිලධාරී


## විවිධ


38 උපන්දින සුභ පැතුම්

39 ප්‍රහේලිකාව

41 දසුනේ හසුන සහ සුභ මංගලම්





1 19 වන යුද්ධ හමුදා පැරා ක්‍රීඩා තරඟාවලියේ ජය ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවට 2016. 10. 14



2 ශ්‍රී ලංකා පාබල හමුදා රණවිරු සැමරුම් උළෙල - 2016 2016. 10. 22



3 ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 27 වන සංවත්සරය 2016. 10. 23



4 වීර ක්‍රියා පදක්කම් පැළඳවීමේ උත්සවය 2016. 11. 13



5 පාබල මේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය 2016 2016. 12. 16




## කවරයේ කථාව

ආසේමු (කිලි) ආඥාපති හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේඑච්ඩීඑච් කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයු පීඑස්සී තුමන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන්ගේ සුරතින් 2016.10.27 වන දින වීරක්‍රියා පදක්කම් පිරිනැමීමේ උළෙලේදී රණවික්‍රම පදක්කම ලබාගන්නා අවස්ථාව කැමරා කාචයේ සනිටුහන්වූ අයුරු.

**ඡායාරූපය : යුද්ධ හමුදා මාධ්‍ය ඒකකය**


**PRINTING & PUBLISHING**

**REGIMENTAL CENTRE SRI LANKA LIGHT INFANTRY**

**Telephone**- 0112855204 / 0112855357 - 59

**Ext**-57656 **Fax**- 0112855204

**E-mail**-editor.whitehackle@gmail.com

**Website**- www.army/lightinfantry.lk

# සුභ මොහොතින් නව තනතුරට පත්වූ ඔබට
# රෙජිමේන්තු අධිපති ඇතුලු සියලු නිලයින්ගේ උණුසුම් සුභපැතුම් !



අණදෙන නිලධාරි 15 ශ්‍රිලපාහ
නි/63175 ලුතිතන් කර්නල්
එච්කේජේයූ ජයරත්න ශ්‍රිලපාහ



දෙවන අණදෙන නිලධාරි 12 ශ්‍රිලපාහ
නි/64232 මේජර්
කේඒකේ කරුණාරත්න
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රිලපාහ



2 වන අණදෙන නිලධාරි 1 ශ්‍රිලපාහ
නි/65035 මේජර් කේඒ කුඩව්ච්
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රිලපාහ



විධායක අධිකාරි 4 ශ්‍රිලපාහ
නි/68020 කපිතන් එන්ඩීපී
වික්‍රමසිංහ ශ්‍රිලපාහ



විධායක අධිකාරි 6 ශ්‍රිලපාහ
නි/69099 කපිතන්
එච් රත්නායක ශ්‍රිලපාහ



විධායක අධිකාරි 26 ශ්‍රිලපාහ
නි/68210 කපිතන්
ආර්එස්එච්එස් චතුරංග ශ්‍රිලපාහ



බුද්ධි නිලධාරි 4 ශ්‍රිලපාහ
නි/69143 කපිතන්
එම්ඒබීආර් මල්ලවආරච්චි ශ්‍රිලපාහ



බුද්ධි නිලධාරි 25 ශ්‍රිලපාහ
නි/69909 ලුතිතන්
කේඑම්එස්එම් කෝනාර ශ්‍රීලපාහ



බුද්ධි නිලධාරි 26 ශ්‍රිලපාහ
නි/69440 ලුතිතන්
එම්කේපීයූ ගුණරත්න ශ්‍රීලපාහ



බුද්ධි නිලධාරි 6 ශ්‍රිලපාහ
නි/69366 ලුතිතන් යූඑම් හේරත්



විධායක අධිකාරි 25 ශ්‍රිලපාහ
නි/69603 ලුතිතන්
ඒආර් මදුසංක ශ්‍රිලපාහ



රෙජිමේන්තු සැරයන් මේජර්
4 ශ්‍රිලපාහ සෙ/314538 බනි 1
එච්ඒ අනුර ශාන්ත



රෙජිමේන්තු සැරයන් මේජර්
8 ශ්‍රිලපාහ සෙ/309808 බනි II
ජයරත්න හේරත් එච්එම්



උපකරණ පාලන සැරයන් මේජර්
8 ශ්‍රිලපාහ සෙ/313539
බනි II සරත් ඒකේ



ප්‍රධාන ලිපිකරු 26 ශ්‍රිලපාහ
සෙ/314392 ව/සැරයන්
ජිනේන්ද්‍ර යූවී




ප්‍රධාන ලිපිකරු 25 ශ්‍රිලපාහ
සෙ/309983 සැරයන්
සම්පත් ඩීඑච්ටී

රෙම් ශ්‍රීලපාහ පුවත්

# කොරියානු ආරක්ෂක විශ්ව විද්‍යාල නියෝජිතයින්ගේ රෙම් ශ්‍රීලපාහ සංචාරය

වයිට් හැකල් ප්‍රකාශන අංශය විසිනි

කොරියානු ආරක්ෂක විශ්ව විද්‍යාල ප්‍රධානි ලුතිතන් ජෙනරාල් වී, ශිවුන්ග් හෝ (Lt Gen Wee, Seung Ho), ලුතිතන් කර්නල් ෂොන්ග්, ක්යෙන්ග්හෝ (Lt Col Son, Kyengho) සහ ලුතිතන් ලිම්, යෙන් හුන්ග් (Lt Lim, Yeon Hyung ) යන කොරියානු ආරක්ෂක විශ්ව විද්‍යාල නියෝජිත පිරිස 2016 ඔක්තෝබර් 16 දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සංචාරයක නිරත විය. රෙජිමේන්තු අධිපති තුමන් වෙනුවෙන් කර්නල් ඒඑස් වික්‍රමසේන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් විසින් මෙම කොරියානු නියෝජිත පිරිස පිළිගන්නා ලදී. මෙහිදී පාබල හමුදා රණවිරු ස්මාරකය තුලින් පිළිබිඹු වන සංකල්පය ඔවුන්ගේ ඉමහත් ඇගැයීමට ලක්විය.











# ශ්‍රී ලංකා පාබල හමුදා
# රණවිරු සැමරුම් උළෙල 2016

වයිට් හැකල් ප්‍රකාශන අංශය විසිනි



1900 වර්ෂයේ අප්‍රිකාවේ පැවති බෝයර් යුද්ධයේදී 1900.02.01 වන දින දිවි පිදූ ලුතිතන් එච්ඩී තෝමස් සහ අවසන් මානුෂීය මෙහෙයුමේදී බරපතල තුවාල ලබා 2009.08.09 වන දින දිවිපිදූ 20 ශ්‍රීලපාහ ඒකකයට අයත් ලාන්ස් කෝප්‍රල් සෙනෙවිරත්න ජේපීඩීඑස්කේ විරුවා ඇතුලු මව් බිමේ නිදහස හා ස්වෛරීත්වය උදෙසා දිවිපුදන ලද නිලධාරීන් 168 ක්ද, සෙසුනිලයින් 3700 ක්ද අනුස්මරණය කිරීම සඳහා ආසේමු (කිළි) ආඥාපති හා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේවීඩීඑ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී තුමන්ගේ ප්‍රධානත්වයෙන් රෙජිමේන්තු රණවිරු ස්මාරකය අභියස දී 2016ක් වූ ඔක්තෝබර් මස 22 වන දින අභිමානවත් රණවිරු සැමරුම් උත්සවයක් පවත්වන ලදී.



ශ්‍රී ලංකා පාබල හමුදා යුද විරුවන් සදා අනුස්මරණය කිරීම උදෙසා එවකට සිටි යුද්ධ හමුදාධිපති හා රෙජිමේන්තු අධිපති වූ ජෙනරල් ආර්එම්ඩී රත්නායක (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ සංකල්පයකට අනුව පාබල හමුදා රෙජිමේන්තු පරිශ්‍රය තුල ඉදිකරන ලද මෙම රණවිරු ස්මාරකය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සුරතින් 2015 ඔක්තෝබර් මස 26 වන දින විවෘත කිරීමෙන් අනතුරුව පැවති මෙම ප්‍රථම රණවිරු සැමරුම් උත්සවය සඳහා මියගිය රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයින් 2500කට අධික පිරිසක් එදින අභිමන් මුදුනත අභියසට රැස්විය.

මෙම උත්සවය සඳහා හිටපු යුද හමුදාපතිවරුන් දෙපළක් වන ජෙනරල් එස්එච්එස් කෝට්ටේගොඩ (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී හා ජෙනරල් ආර්එම්ඩී රත්නායක (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ඇතුලු විශ්‍රාමික සහ සේවයේ යෙදී සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් සහභාගී වූ අතර මෙම රණවිරු සැමරුම් උත්සවය අභිමානවත්ව වාර්ෂිකව ඉදිරියට පැවැත්වීමට නියමිතය.





















# ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 27 වන සංවත්සරය

වයිට් හැකල් ප්‍රකාශන අංශය විසිනි



1983 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ ත්‍රස්ථවාදී ක්‍රියා උත්සන්න වීමත් සමගම ශ්‍රී ලංකා යුධ හමුදාව විශාල වශයෙන් ව්‍යාප්ත වීමට පටන් ගැනිණි. එම ව්‍යාප්තියත් සමඟ බළඇණි වල පරිපාලනමය කටයුතු විධිමත් කිරීම සඳහා සුදුසු මූලස්ථානයක් වශයෙන් රෙජිමේන්තු මධ්‍යස්ථාන ආරම්භ කිරීමට කටයුතු සිදුකරන ලදී. ඒ අනුව එවකට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යුද්ධ හමුදාධිපති වශයෙන් කටයුතු කල ලුතිතන් ජෙනරාල් එච් වනසිංහ වීඑස්වී විසින් හමුදා චර්යා නියෝග 37/89 හා 1989 ජුනි 30 දිනැති විශේෂ හමුදා චර්යා නියෝග මඟින් මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම සඳහා නියෝග නිකුත් කරන ලදී. එම නියෝගය අනුව මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානය 1989 ඔක්තෝබර් මස 23 වන දින පනාගොඩ යුධ හමුදා ජනපදයේ 1 වන පාබල හමුදා බළඇණි මූලස්ථානය පිහිටි ස්ථානයේදී ස්ථානගත කර රෙජිමේන්තු ධජය ඔසවා ආරම්භ කරන ලදී.

ඒ අනුව ආරම්භ කරන ලද ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 27 වැනි සංවත්සරය 2016 ඔක්තෝබර් 23 වන දින අභිමානයෙන් සමරන ලදි. යුද හමුදා සම්ප්‍රදායන්ට සහ ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් චාම් එහෙත් අභිමානවත් අයුරින් සමරන ලද සංවත්සර දිනයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වූ පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේවීඩීවී කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී තුමන් වෙත කඳවුරු සම්මාන මුරයක් සමඟින් වර්ණ ධජ සණයන්ගෙන් සමන්විත සම්මාන පෙළපාලියක් ලබාදෙන ලදී. මෙම පෙළපාලියේ අණදෙන්නා වශයෙන් 7 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එම්පීඑස්පී කුලසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ සහභාගී වූ අතර, නිලධාරීන් 69 ක්ද මංගල හස්ටියා සමඟින් සෙසුනිලයින් 667 ක්ද රෙජිමේන්තු වර්ණ ධජ සණය සමඟින් 1 ශ්‍රීලපාහ වර්ණ ධජ සණය හා 2 (සේවි) ශ්‍රීලපාහ වර්ණ ධජ සණයද සහභාගී විය. පෙළපාලියෙන් අනතුරුව සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලදී. මෙම සංවත්සර දිනයේ අවසන් අංගය ලෙස පැවති සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාව අවසානයේ සංඝයාවහන්සේලා දෙලොස්නමක් විෂයෙහි හීල් දානය පිරිනැමීමෙන් පසු 27 වන රෙජිමේන්තු දිනය නිමාවට පත් කරන ලදී.







රෙම ශ්‍රීලපාහ පුවත්

# පාබල විරුවන් හට වීර ක්‍රියා පදක්කම් පැළඳවීමේ උත්සවය

**යුද බිමේ දක්වන ලද අභීත රණකාමීත්වය ඇගයීම වස් හිමිගැන්වූ වීර පදක්කම් ප්‍රදානය කිරීමේ දෙවන අධියර යටතේ ශ්‍රී ලංකා පාබල හමුදා රණවිරුවන් සඳහා වීරෝධාර විභූෂණ පදක්කම් 01ක් ද වීර වික්‍රම විභූෂණ පදක්කම් 06 ක්ද, රණවික්‍රම පදක්කම් 285 ක්ද, රණශූර පදක්කම් 749 ක්ද හිමිවිය.**



**වයිට් හැකල් ප්‍රකාශන අංශය විසිනි**

2016.10.27 දින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන්ගේ සුරතින් බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී වීරෝධාර විභූෂණ පදක්කම් 01ක්ද, වීර වික්‍රම විභූෂණ පදක්කම් 06ක්ද, රණ වික්‍රම පදක්කම් 09ක්ද, රණ ශූර පදක්කම් 07ක්ද පලඳවන ලද අතර 2016 නොවැම්බර් 03 දින යුද්ධ හමුදාපති ලුතිනන් ජෙනරල් ඒඩබ්ලිව්ජේසී ද සිල්වා ආර්ඩබ්ලිව්පී ඒවීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් විසින් පනාගොඩ යුද හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී රණ වික්‍රම පදක්කම් 26 ක්ද, රණ ශූර පදක්කම් 42 ක්ද අප පාබල රණවිරුවන් හට පලඳවන ලදි.









මෙම උත්සව මාලාවට සමගාමීව ආසේමු (කිලි) ආඥාපති හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේවීඩීවී කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විඑස්වී යුඑස්පී එන්ඩීයු පිඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ ප්‍රධානත්වයෙන් 2016.11.13 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රසල් හයින් ක්‍රීඩාපිටියේදී අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලද වීර ක්‍රියා පදක්කම් පැලඳවීමේ උත්සවයේදී මියගිය රණවිරුවන් වෙනුවෙන් ඔවුන්ගේ ලඟම ඥාතින් වෙත රණ වික්‍රම පදක්කම් 21ක් හා රණ ශූර පදක්කම් 03ක්ද පිරිනැමූ අතර, විශ්‍රාමික රණවිරුවන් වෙත රණ වික්‍රම පදක්කම් 02 ක්ද, රණ ශූර පදක්කම් 03 ක්ද සේවයේ යෙදී සිටින නිලධාරි සහ සෙසුනිලයින් වෙත රණවික්‍රම පදක්කම් 27ක් හා රණශූර පදක්කම් 19ක් රෙජිමේන්තු අධිපති තුමන් විසින් පලඳවන ලදි. තවද ඉතිරි වීර ක්‍රියා පදක්කම් රෙජිමේන්තු මහා කාරක සභික ජ්‍යෙෂ්ඨ නිලධාරින් විසින් රණවිරුවන් වෙත පලඳවන ලදි.














රණවිරු සුභසාධන කටයුතු සඳහා අරමුදල් රැස්කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය විසින් වාර්ෂිකව පවත්වනු ලබන පාබල මේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය 2016 දෙසැම්බර් මස 16 හා 17 දෙදින තුල හික්කඩුව මහජන ක්‍රීඩාංගනයේදී අති සාර්ථකව සිව් වැනි වරටත් පවත්වන ලදී.

**වයිට් හැකල් ප්‍රකාශන අංශය විසිනි**

ප්‍රථම දින මෙම සැණකෙළියේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආසේමු (කිළි) ආඥාපති හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේව්ඩීව් කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්වස්පී ව්වස්ව් යූවස්පී වන්ඩියූ පිවස්සී තුමන් සහභාගී වූ අතර, වතුමන් ගේ සුරතින් චාරිත්‍රානුකූලව පොල්තෙල් පහන දල්වා මෙම උත්සවයේ සමාරම්භක අවස්ථාව සනිටුහන් කරන ලදී. ශ්‍රී ලංකා පාබල හමුදාවේ සරඹ,තූර්යවාදක හා සංස්කෘතික නර්තන සංදර්ශන, කොමාන්ඩෝ රෙජිමේන්තුවේ සුනඛ සංදර්ශන, ශ්‍රී ලංකා පොලිස් ජෝවා බලකායේ ත්‍රාසජනක යතුරුපැදි සංදර්ශන, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය විසින් ඉදිරිපත් කරන ලද ඉතා කෙටි වේලාවකදී මෝටර් රථයක් වකලස් කිරීම , සන්නද්ධ රථ සහ අවි ප්‍රදර්ශනය ප්‍රේක්ෂකයන්ගේ සිත් ගත් අංගයන් විය.

අතිවිශාල ජනකායක් මධ්‍යයේ පැවති මෙම දෙදින සැණකෙළිය ෆ්ලෑෂ්බෑක් සංගීත කණ්ඩායම හා සනිධප සංගීත කණ්ඩායම සමඟින් සංගීතවත් වූ අතර, දිවයිනේ සුප්‍රසිද්ධ ගායක ගායිකාවන් රැසක් අමාලි ප්‍රමුඛ ස්ටාර් ඩාන්ස් හා පිණිරූ නර්ථන කණ්ඩායම් සමඟින් ද, කථනයෙන් ඩෙන්සිල් නුගේගොඩ ද පාබල මේලා සැණකෙළිය වර්ණවත් කරන ලදී. තවද ඉතා වටිනා ත්‍යාග රාශියක් ප්‍රදානය කරන ලද පාබල මේලා ලොතරැයි දිනුම් ඇදීම සැණකෙළියේ දෙවන දින සිදු කරන ලදී.



# යුද හමුදා සංදර්ශන



සුනඛ සංදර්ශනය - රෙමකරෙ




යතුරුපැදි සංදර්ශනය - ශ්‍රීලයුපොහේබ



යතුරුපැදි සංදර්ශනය - ශ්‍රීලයුපොහේබ



ඉතා කෙටි වේලාවකදී ජීප් රථයක් සම්පූර්ණයෙන් ගලවා සවිකිරීම - ශ්‍රීලංවියාඉ



සරඹ සංදර්ශනය - රෙම ශ්‍රීලපාහ සරඹ කණ්ඩය



තූර්යවාදන සංදර්ශනය - රෙම ශ්‍රීලපාහ තුවාක අංශය

## ලොතරැයි දිනුම් ඇදීම





## සංගීත සංදර්ශන









# නිලධාරි සුහද හමුව

**වයිට් හැකල් ප්‍රකාශන අංශය විසිනි**

රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේවීඩීවී කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරිතුමන්ගේ සංකල්පයකට අනුව වසර ගණනාවකට පසු ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවට අයත් දැනට සේවයේ යෙදී සිටින සියලුම නිලධාරීන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුහදත්වය වර්ධනය කිරීම සඳහා 2016 දෙසැම්බර් මස 30 වන දින රෙම ශ්‍රීලපාහ නිලධාරි නිවස්නයේදි නිලධාරී සුහද හමුව අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වින. සංගීත සහ නර්තන අංග මෙන්ම ටොම්බෝලා ලොතරැයි ක්‍රීඩාව සමගින් කුඩා ළමුන් සඳහා විනෝද ක්‍රීඩා ඇතුලු විවිධ විශේෂාංග රැසකින් සමන්විත වූ මෙම සුහදතාවය සෑම වසරක් පාසාම සිදුකිරීමට ද සැළසුම් කර ඇත.













# අභිමංසල පාන්ගොල්ල සංචාරය

**ශ්‍රීලපාහ සේවා වනිතා ශාඛාව විසිනි**





ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය වන ධනංජනී කරුණාසේකර මැතිණිය ප්‍රමුඛ සෙසු සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් කුරුණෑගල පාන්ගොල්ල අභිමංසලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් බැලීම සඳහා 2016 ඔක්තෝබර් මස 08 වන දින සිදුකරන ලද සංචාරයේදී අභිමංසල වෙත රු.50000.00 ක වටිනාකමකින් යුත් තණකොළ කපන යන්ත්‍ර 03ක් හා තෑගි පාර්සල් 38ක් ලබා දුන් අතර, නේවාසික රණවිරුවන් සඳහා එදින දිවා ආහාරය ලබාදීමට ද කටයුතු කරන ලදි.









සේවා වනිතා පුවත්

# වෛද්‍යාධාර

2016 ඔක්තෝබර් මස 17 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණිය වන ධනංජනී කරුණාසේකර මැතිණිය විසින් ක්‍රියාන්විත රාජකාරියේදී මියගිය 5(සේවී) ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/5ඩී01621 කෝප්‍රල් සමරකෝන් එස්ආර්සීවී කොනොනිගේ ස්නායු ආබාධිත තත්වයෙන් පෙළෙන දරුවා හට වෛද්‍ය ප්‍රතිකාර සඳහා ඔහුගේ බිරිඳ වන ඩබ්එම් අයිරාංගනී මහත්මිය වෙත රු.50000.00ක වටිනාකමකින් යුත් ප්‍රේෂණපතක් ද, 11 ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/330427 ලාකෝ ඒකනායක ආර්ආර්පීආර්කේ කොනොනිගේ බිරිඳ හට තුන්දරු උපතක් සිදුවීම හේතුවෙන් එම දරුවන්ගේ අවශ්‍යතා සඳහා රු.50000.00ක වටිනාකමින් යුත් ප්‍රේෂණපතක් හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සේවයේ නියුතු සිවිල් සේවක එච්ඒඩී ජයරත්න මහතාගේ ස්නායු ආබාධිත තත්වයෙන් පෙළෙන බිරිඳ හට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා රු. 30000.00ක මුදලක් ද පරිත්‍යාග කරන ලදි.



සෙ/330427 ලාකෝ ඒකනායක ආර්ආර්පීආර්කේ



සෙ/5ඩී01621 කෝප්‍රල් සමරකෝන් එස්ආර්සීවී කොනොනිගේ බිරිඳ



සිවිල් සේවක එච්ඒඩී ජයරත්න මහතා

# නිවාස ආධාර



ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිතුමියගේ සංකල්පයකට අනුව ශ්‍රීලපාහ සේවා වනිතා ශාඛාවේ මූල්‍යමය දායකත්වය ඇතිව මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රාජකාරී කරනු ලබන සිවිල් සේවක ප්‍රියන්ත කුමාර ද සිල්වා මහතා හට නව නිවසක් ඉදිකිරීම සඳහා 2016.12.02 වන දින හෝමාගම පිටිපන ප්‍රදේශයේ ඔවුන්ට අයත් ඉඩමේදී මුල්ගල තබන ලදි.



ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය වන ධනංජනී කරුණාසේකර මැතිණියගේ සංකල්පයකට අනුව ශ්‍රීලපාහ සේවා වනිතා ශාඛාවේ මූල්‍යමය දායකත්වය ඇතිව පහත නම් සඳහන් අයවලුන් හට සහ යුද්ධයේදී මියගිය රණවිරුවන්ගේ ලඟම ඥාතීන් වෙත මූල්‍ය ආධාර ලබාදීමේ වැඩපිළිවෙලක් සංවිධානය කරන ලද අතර, 2016 දෙසැම්බර් මස 28 වන දින රෙජිමේන්තු ශ්‍රවනාගාරයේ දී මෙම වැඩපිළිවෙල ක්‍රියාවට නංවන ලදි. මේ අනුව නිවාස ආධාර, දරුවන්ගේ අධ්‍යාපනය නගාසිටුවීම සඳහා ආධාර ලබාදීම හා වෛද්‍ය පහසුකම් ලබාගැනීම සඳහා ආධාර පිරිනැමීම සිදු කරන ලදි. මෙම උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස පාබල හමුදා රෙජිමේන්තු අධිපති සමගින් ශ්‍රීලපාහ සේවා වනිතා සංගමයේ ගරු සභාපතිණිය ඇතුලු ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් රැසක් සහභාගී වූ අතර, මෙම අවස්ථාවට මධ්‍යස්ථාන සේනාවිධායක තුමන් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද සහභාගී විය.





## නිවාස ආධාර

| | | | | |
|---|---|---|---|---|
| සෙ/311052 | ඛනි I | සීකේ අලහකෝන් (ආර්එස්පී) | - | රු. 500,000.00 |
| සෙ/14671 | ව/සැරයන් | ප්‍රේමචන්ද්‍ර ඩී | - | රු. 100,000.00 |
| සෙ/302577 | සැරයන් | දිසානායක ඩීඑම් | - | රු. 200,000.00 |
| සෙ/308782 | කෝප්‍රල් | ප්‍රනාන්දු එම්එස්කේ | - | රු. 100,000.00 |
| සෙ/311846 | සාසෙ | සුසන්ත කුමාර ඩබ් (මියගිය) | - | රු. 100,000.00 |

## අධ්‍යාපන අවශ්‍යතා සඳහා ආධාර

මෙම වැඩසටහන යටතේ පහත නම් සඳහන් නිලධාරි සහ සෙසුනිලයින් ගේ දුවා දරුවන් හට එක් අයෙක් සඳහා රු. 25000.00 බැගින් රු. 350000.00 ක මුදලක් ලබාදෙන ලදි.

| | | | | | |
|---|---|---|---|---|---|
| නි/4121 | ලුතිං කර්නල් | ඩබ්ලිව්වයිකේ වීරසිංහ ශ්‍රීලපාහ | සෙ/9ඩී00070 | සැරයන් | පෙරේරා පීආර්ටී (විශ්‍රාමික) |
| සෙ/22ඩී00011 | ඛනි I | එස්එස්එම්එස් සමන් කුමාර | සෙ/16ඩී00083 | සැරයන් | ජගත් කුමාර එච්චිල් |
| සෙ/9ඩී00200 | ඛනි II | සමරසිංහ ජයලත් ජේවී | සෙ/16ඩී00017 | කෝප්‍රල් | ජයකොඩි කේඑම් (විශ්‍රාමික) |
| සෙ/9ඩී00012 | ඛනි II | සුනිල් ආර්ඩී (විශ්‍රාමික) | සෙ/18ඩී00078 | කෝප්‍රල් | චන්ද්‍රෝ පීඩබ් |
| සෙ/9ඩී00480 | ව/සැරයන් | රත්නායක ආර්එම්එස්ඩී | සෙ/18ඩී00112 | කෝප්‍රල් | ප්‍රේමතිලක පීඒ |
| සෙ/9ඩී00645 | ව/සැරයන් | ප්‍රේමජයත් ඊඩී | සෙ/18ඩී00085 | ලාකෝ | ජනක ජයන්ත පී |
| සෙ/18ඩී00037 | ව/සැරයන් | හේරත් එස්බීඑම්එස් | සෙ/9ඩී00604 | ලාකෝ | සුගත් වීකේ |

## වෛද්‍ය ආධාර

4 ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/315975 ලාකෝ මහින්ද කේවීටී රු. 50000.00

# යුද්ධ හමුදා පැරා ක්‍රීඩා 2016 තරඟාවලියේ අති විශිෂ්ඨ ජයග්‍රහණයක්

19 වන යුධ හමුදා පැරා තරඟාවලියේ සමාප්ති උළෙල 2016 ඔක්තෝබර් මස 14 වන දින පැවැත්විණි. මෙම සමාප්ති උළෙලේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාපති ලුතිතන් ජෙනරල් ඒඩබ්ලිව්ජේසි ද සිල්වා ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයු පීඑස්සි තුමන් සහභාගි වන ලදී. මෙම තරඟාවලිය කණ්ඩායම් තරඟ 11ක් හා මලල ක්‍රීඩා තරඟාවලියකින් සමන්විත වූ අතර, එහිදී පැවති කණ්ඩායම් තරඟ 11 න් පහත සඳහන් ඉසව්වන්ගෙන් ශූරතාවයන් හා අනු ශූරතාවයන් දිනා ගැනීමට රෙජිමුබ ශ්‍රීලපාහ ක්‍රීඩා කණ්ඩායම සමත්විය.

**සවි එසවීම - ශූරතාවය**

**ඔරු පැදීම - ශූරතාවය**

**වොලිබෝල් - ශූරතාවය**
**(බිම වාඩිවී සිටිමින් ක්‍රීඩා කරයි)**

**රෝද පුටු මැරතන් - අනු ශූරතාවය**

මලල ක්‍රීඩා තරඟාවලියේදී නව තරඟ වාර්තා 11ක් බිහි කරමින් මලල ක්‍රීඩා තරඟ ඉසව්වලින් රන් පදක්කම් 25 ක් ලබා ගනිමින් සියලු ක්‍රීඩා කණ්ඩායම් අභිබවා මලල ක්‍රීඩා ශූරතාවය දිනා ගැනීමට රෙජිමුබ ශ්‍රීලපාහ ක්‍රීඩා කණ්ඩායම සමත් විය. මෙහිදී තමන් සහභාගි වූ ඉසව් 3න් ම නව තරඟ වාර්තා පිහිටවමින් රන් පදක්කම් දිනාගත් රෙජිමුබ ශ්‍රීලපාහට අයත් සෙ/321925 කෝප්‍රල් සෝමසිරි ආර්ඩබ්ලිව්... ආර්ඩීසී ක්‍රීඩකයා දක්ෂතම මලල ක්‍රීඩකයාට හිමි කුසලානය හිමි කරගන්නා ලදි. කණ්ඩායම් තරඟවලින් ලබා ගත් ජයග්‍රහණ හා මලල ක්‍රීඩා තරඟාවලියෙන් ලද ජයග්‍රහණයෙන් රන් පදක්කම් 48 ක්, රිදී පදක්කම් 53 ක් සහ ලෝකඩ පදක්කම් 40 ක් සමගින් සමස්ත තරඟාවලියේ ශූරතාවය රෙජිමුබ ශ්‍රීලපාහ කණ්ඩායම හිමිකරගන්නා ලදි. මෙම විශිෂ්ඨ ජයග්‍රහනය අත්කර දුන් පාබල හමුදා රෙජිමේන්තු මූලස්ථාන බළඇණි කණ්ඩායම වෙත ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති තුමන් ප්‍රමුඛ සියලුම නිලයින්ගේ සුභාශිංසන මෙසේ පිරිනමන්නෙමු.







සෙ/321925 කෝප්‍රල් සෝමසිරි ආර්ඊඩීසී
දක්ෂතම මලල ක්‍රීඩකයාට හිමි කුසලානය ලබාගනිමින්





# KANDULA – 'THE KING OF ELEPHANTS'

***This two - part article was published in the Island on 14 and 21 Oct 16 by Rohana R. Wasala. We are very grateful to Maj Gen SMA Jayawardena (retd)VSV ndc psc for sending this descriptive letter***

## PART I

Kandula was the celebrated war elephant of the great warrior king Dutugemunu whose reign was from 161 to 137 BCE. Eleven chapters of the Mahavamsa or the Great Chronicle (Chapters 22 to 32) deal with the story of king Dutugemunu: his birth, childhood, rebellious youth, preparation for war against Elara, the South Indian invader who was occupying Anuradhapura at the time, the ten great warriors who served him and Kandula , his battle elephant and royal mount, with whom he had the closest rapport. As delineated in the Mahavansa, Kandula's exploits in battle were such that he even outshone the ten great warriors who were in the service of his master the king. He is the most famous war elephant in Lanka's history. Since 1961 the Sri Lanka Light Infantry Regiment has had a young elephant as its mascot, which is traditionally named Kandula.

The Mahavamsa, written in Pali verse in the 5th century CE, is a work of literature (an epic poem with Dutugemunu as the epic hero) as much as it is a book of history; neither aspect diminishes the excellence of the other. Mostly, it is fictionalized historical fact, rather than historicized fiction as has sometimes been claimed in certain quarters. The history is that of Buddhism as it related to the island and of the Sinhalese from the Parinibbana (the passing away) of the Buddha (543 BCE) to the end of king Mahasena's reign (277-304 CE). According to the tradition recorded in the book, the arrival in the island of Prince Vijaya, the legendary founder of the Sinhalese race, from North India coincided with the Parinibbana of the Buddha. Incidentally, however, modern historians hold that king Pandukabhaya (474-367BCE), the 6th in the Vijayan line, was the first truly indigenous (Sinhalese) monarch to rule at Anuradhapura exercising sovereignty over the whole of the island. The author of the Mahavamsa was the learned Buddhist monk Mahanama, uncle of king Dhatusena who ruled from 455 to 473 CE. The latter commissioned the historical treatise. The Mahavamsa records the succession of kings following Vijaya, the arrival from Dambadiva (India) of Buddhist missionaries headed by TheraMahinda, son of Emperor Asoka, the establishment of Buddhism in the country under royal patronage, the services done by kings for promoting and protecting Buddhism, and the problems they faced, etc. In spite of liberal use of poetic license in embellishing the nuclear facts something that is evident in the story of Kandula the elephant itself), the basic historical information recorded is supported by extant epigraphic evidence found throughout the island, and in other literary sources. Each of the 39 chapters of the Mahavamsa ends with the refrain: "For the serene joy and emotion of the pious". The book is effectively a Buddhist philosophical poem that deals with the history of the tri-aspectual unity that consists of the Sinhalese, Buddhism and the island.

At the beginning of his military struggle to drive away the invader Elara, prince Gemunu declared that his struggle was not for the sake of the glory of kingship, but that his whole purpose was the advancement of the Buddhist dispensation. The young warrior thought of a strategy to win the loyalty and support of the people of the districts that he had to pass through during his march towards the main stronghold of king Elara at Anuradhapura. What he did was to have a group of Buddhist monks in the vanguard of his army, which needless to say, consisted of the four divisions of the ancient Sinhalese military forces: elephantry, cavalry, chariot borne, and infantry battalions.

Prince Gemunu was adept in riding both elephants and horses and using them in battle. Kandula being the close companion of the prince from birth enjoyed a privileged status before, during, and even after his master's campaigns. In terms of the Mahavamsa narrative, Kandula was one of 'the precious things' that became available to king Kavantissa on the day of the prince's birth 'by the effect of his merit'. On that very day, there arrived (at the port) seven ships (launched) from various places and laden with many different ewels; and another ship 'filled with gold and so forth' had also arrived. Similarly, an elephant of the 'chaddanthakula' (six-tusked caste) brought its (new born) calf and left it in a jungle near the shore, where a fisherman named Kandula found it and directly informed the king about it. (The clairvoyant parent elephant must have been the father of the baby elephant, considering the importance of attesting the chaddantha ancestry of Kandula). The king ordered his men to go and bring the elephant calf to the palace. He named it Kandula because that was the name of the person who found it. Though he was credited to be of the Chaddanta breed, he was two-tusked and created no problem for being used in war. The king had his men bring to him the treasures from the ships, as well. These treasures including Kandula were, in effect, miraculous birthday presents for prince Gemunu.

As implied in the story, Kandula was the same age as the prince, and they grew up together. But Gemunu's younger brother Tissa also liked Kandula. When prince Gemunu fled to Malayarata after quarrelling with his father over the latter's reluctance to let him wage war against Elara, he left his elephant behind at Mahagama, the capital of the kingdom of Ruhunu. (Gamani/Gemunu came to be called Dutthagamani or Dutugemunu, 'Gamani/Gemunu the Villainous' because of this tiff with his father.) It was during his absence from Ruhuna that king Kavantissa died. Prince Tissa was also away at Dighavapi, where the

deceased king had stationed him with soldiers and chariots ready for mobilization at any time. Dighavapi lay between the kingdom of his father and the part of the country occupied by Elara. The widowed queen took the king's body to Tissamaharama, where prince Tissa arrived from Dighavapi. Having performed the funeral rites, Tissa went back to Dighavapi, taking with him his mother queen Viharadevi, and the elephant Kandula. Though Gamani/Gemunu, in his youthful impetuosity, had called his father a coward and earned his wrath, the latter had already been making all necessary preparations to fight the invader for he had been assured by an omen at the name-giving ceremony for the new born prince that he (who was later named Gamani) was destined to rule over the whole of the island kingdom after freeing it from foreign invaders and to make the doctrine of the Buddha shine forth in all its brilliance. King Kavantissa did not give in to the young prince's reckless haste probably because he thought that an assault on the invader at that time was still premature.

Now, learning about king Kavantissa's death, prince Gemunu returned to Mahagama and got himself consecrated king as was his right as the elder of the two princes. He then asked his brother to return to him their mother and the elephant Kandula. Though the request was repeated three times, Tissa turned it down. The dispute led to war between the two brothers, despite their having been made to swear solemnly in their childhood by their father not to make war on each other. In the confrontation that followed, Tissa seemed to have an advantage over his brother in riding to battle upon Kandula, while Gemunu had to fight on horseback. It was a mare named ighathunika. Gemunu suffered a humiliating defeat, and many of his men were killed. He escaped on his horse, with Tissa in hot pursuit riding Kandula. But the king was not ready to give in to his brother. At Mahagama, he collected a large army and attacked his brother again. This time too, Gemunu was riding his mare Dighathunika, and Tissa the elephant Kandula. Gemunu on his mare circled his brother atop Kandula, looking for an unprotected place to attack, but found none (as presumably both Tissa and Kandula were covered with protective armour). So, Gemunu made Dighathunika leap over the elephant with him on her back, and launched a javelin over his brother (so as not to hurt him), which only grazed the skin of the elephant. Many men died on both sides. Kandula felt dishonoured and humiliated by a female jumping over his back, and was angry (He didn't care if it was a horse or an elephant! What hurt him was that it was a female!). He thought: "A female has treated me with contempt because of the weakness of the rider". Thus thinking, he rushed upon a tree in order to throw Tissa off his back. Tissa held on to a branch of the tree and Kandula went back to his true master, Gemunu, who then got on to his back and pursued the fleeing Tissa. The change of his mount, however, didn't do him any good, because Tissa climbed down from the tree and made good his escape. He went and hid in a monastery. Had Gemunu ridden Dighathunika instead of Kandula, the result would have been different, though. This would have been further humiliation for Kandula.

## PART II

After these two internecine battles between them, Gemunu and Tissa became reconciled through the intervention of the Sangha and their mother queen Viharadevi. Then they addressed hemselves to the campaign against the Damilas. Gemunu, mounted upon the back of Kandula, led his army (consisting of troops under his ten great warriors), capturing a number of enemy outposts down along the Mahaveli river, on his march towards Anuradhapura. The Damilas who survived these battles escaped to a large fortress known as Vijithanagara. Clearly many battle elephants took part in this campaign beside Kandula. In fact, all the four divisions of the army contributed to these victorious operations, although the Mahavamsa author does not mention any extraordinary feats performed by Gemunu, Kandula, or the ten warriors at this stage.

The Sinhalese forces set up camp before the fortified Vijithanagara. Before launching his attack on the city's fortifications, Gemunu wanted to make trial of the strength of one of his ten great warriors called Nandimitta. He caused Kandula to be let loose upon Nandimitta who was coming to him. But the undaunted Nandimitta seized the animal by his tusks and forced him onto his haunches. The elephant thus humiliated bore some ill will towards Nandimitta. But this was not going to be for long.

Kandula featured prominently in the operation that breached the defences at Vijithanagara after a four-month long siege, which was a decisive moment for the approaching victorious end to Dutugemunu's campaign. In historical narratives including the Mahavamsa, Kandula is invested with human intelligence and human emotions. According to the Mahavamsa account, the fortress had five gates. Nandimitta, Suranimala, and Kandula assaulted the southern gate, while Velusumana the champion horseman led the attack on the eastern gate. Gothaimbara, Theraputta Abhaya, and Mahasona stormed the other three gates. Strangely, Kandula had been employed to batter down the gate without a rider, and without a protective covering. When he attacked the gate of iron with his tusks, the defenders upon the gate-tower hurled all kinds of weapons at him; but he didn't budge.

Then they poured molten pitch on his back. In excruciating pain, Kandula ran into a pool of water and dived there. Gothaimbara chided him: "Here is no sura-draught for thee, go forth to the destroying of the iron gate, destroy the gate. Then did the best of elephants proudly take heart, and trumpeting, he reared himself out of the water and stood defiantly on firm land". Now, the elephant's physician washed the pitch away and applied balm. They covered his back with a seven times folded buffalo hide, and fed him with the choicest fodder. Gemunu got onto his back, and stroked his temples, saying encouraging words: "To thee I give, dear Kandula, the lordship over the whole island of Lanka". He roared like thunder and attacked the gate. Nandimitta dashed aside with his mighty arm the huge chunks of masonry falling from the gate-tower just in time before they fell on Kandula's back injuring him. Seeing this deed, the elephant put an end to the resentment he had been nursing against Nandimitta since the day the latter humiliated him by forcing him to sit on the ground. (Quotes in this paragraph, and phrases elsewhere marked off with inverted commas are from Geiger's translation of the Mahavamsa.)

The heroes, however, did not want to be under obligation to "the best of elephants" for breaching the wall for their entry into the enemy fort. It looked as if they wanted to keep Kandula in his place in spite of the royal patronage

he enjoyed. When Kandula turned to Nandimitta wanting him to enter the fort through the breach he made, the latter ignored Kandula's cue, and made an opening in the wall with his arm and went in; similarly, Suranimala dashed forward and leapt over the wall into the city; Gothaimbara and Mahasona smashed the wall separately for themselves. Obviously, Kandula was a victim of peer rivalry.

After entering the city, Kandula and the other heroes, each by himself, wreaked havoc on the Damilas there. The weapons wielded by the human warriors, according to the Mahavamsa author, were as follows: the club that Theraputta used was thirty-eight inches thick and sixteen cubits long; Gothaimbara's weapon was a coconut tree, while Mahasona's was a palmyra tree; Suranimala (so called because he was a toddy guzzler, his real name was Nimala or Nirmalaya), brandished a sword (we are not told how big) which had to match the dimensions of what were in his friends' hands. Nandimitta, not to be outmatched in the choice of weapons, swung about the frame of a chariot, crushing the enemies with it. Only Kandula is depicted as wielding something more realistic and plausible:
his weapon was a chariot-wheel held in his trunk.

The duel between Gemunu and Elara, each mounted on his elephant, decided the final outcome of the war. It took place near the south gate (the gate that Kandula brought down). Elara hurled his spear at Gamani, but the latter evaded it adroitly; while making Kandula stab with his tusks Elara's elephant (Mahapabbata or Mighty Mountain), Gamani attacked Elara with his spear. Both Elara and his elephant fell dead or mortally wounded. Thus, in the war waged to wrest their homeland from foreign Damila domination for the Sinhalese and for Buddhism, Dutugemunu shared the glory of his final victory over the Damila invader with Kandula, the noble beast which became his lifelong possession on the very day of his birth by "the effect of his merit", though the other heroes were still in the background making their own mighty contributions to the final victory. But Kandula's war elephant role did not end here.

Dutugemunu treated the dead enemy with magnanimity. Elara himself, who had ruled over the Sinhalese of the occupied territory for forty-four years (205-161 BCE), was reputed as a righteous ruler, and his memory is honoured to this day by the Sinhalese. (Where else do racist chauvinists honour their enemy from a different race like that?)

After the fall of Vijithanagara, but before this encounter between Gamani and Elara, Dighajantu, Elara's general, had advised the king to send for his (Elara's) nephew Bhalluka in India to come with reinforcements for defending the capital, Anuradhapura. However, when Bhalluka landed at Mahatittha (Mahatota, Tamilized as Mantottam now)with 60,000 troops, it was already six days after the funeral of Elara. Dutugemunu, mounted upon Kandula, led his four-fold army consisting of foot soldiers and troops riding on elephants, horses, and chariots. Bhalluka went straight for the king, but Kandula slowly gave ground. Phussadeva, the master archer was with the king. The king asked Phussedeva why Kandula, who didn't retreat in the previous twenty-eight battles, was doing this now. The archer answered: "Victory lies behind us, o king; looking to the field of victory he will halt". Kandula retreated until he reached the shrine of the guardian deity of the city, which was within the precincts of the Mahavihara, and stood firm. The DamilaBhalluka came there and mocked Dutugemunu. The latter covered his mouth with his sword and returned insult for insult. Bhalluka let fly an arrow at the king's mouth. The arrow struck the sword blade and fell on the ground. Bhalluka, thinking that the king was struck in the mouth shouted for joy "He's struck in the mouth".But the ace archer Phussadeva, seated behind the king, shot an arrow straight into Bhalluka's mouth. Phussadeva saw Bhalluka falling back with his feet towards the king, and he immediately let fly another arrow at the man's knee making him fall with his head towards the king. With the defeat of Bhalluka, Dutugemunu's military campaign against the invader for the unity of the state and for the protection of Buddhism came to an end.

And peace began to reign in the island. Kandula continued to receive the affection and the loving care of the king as his mangalahaththi (Elephant the Auspicious). Deeply remorseful for having caused the death of many human beings during his campaigns (which, though, he carried out, not for the joy of sovereignty, but for the efflorescence of the doctrine of Buddhism) he engaged in meritorious work. The largest Buddhist edifice that he undertook to build was the MahaStupa (the Ruwanmelisaya). The Mahavamsa says that the inauguration ceremony of the cetiya (the stupa) was attended even by foreign including Greek monks from Alisanda (Alexandria in Afghanistan).

Just as the moment of glory of Kandula's military past was when he battered down the southern gate of the Vijithanagara fortress and when he later engaged Mahapabbata, Elara's war elephant, during the duel between the two royal combatants that brought victory to his master, his most illustrious peacetime occasion of his life was when the king had him lead the procession in which sacred relics from the world of the Nagas were received for enshrining in the MahaStupa. Following is how the Mahavamsa (Geiger translation) begins to describe the latter scene:

"On the fifteenth uposatha-day in the evening, (the king) glad at heart, well versed in the duties of kings, arrayed in all his ornaments, surrounded on all sides by his dancing women and his warriors in complete armour, by a great body of troops, as well as by variously adorned elephants, horses and chariots, mounted his car of state that was drawn by four pure white Sindhu-horses and stood there, making the sumptuously) adorned and beautiful elephant Kandula pace before him, holding a golden casket under the white parasol......"

The Mahavamsa doesn't say if Kandula survived his master. But if he did, Tissa would have looked after him with the same love and affection as his brother.

(The main source for this article is the Mahavamsa - Geiger translation. But I have also drawn upon Professor Merlin Peris's KANDULA - The Elephant at War (Godage International Publishers (Pvt) Ltd, Colombo. 2005)for some idea about how elephants were used in battle in ancient Sri Lanka. However, the perceptions and opinions expressed here are entirely mine.) Concluded.

# සිගරට් බොන දෙදෙනකුගෙන් එක් අයෙකු සිගරට් බීම නිසාම මරණයට පත්වේ. එමෙන්ම දිනකට ශ්‍රී ලාංකිකයින් 65 දෙනෙකු සිගරට් බීම නිසා මරණයට පත්වේ!

## සිගරට් බීම නවත්තන්න ඔබත් කැමතිද?

ඉතිං, මම සෑහෙන කාලයක ඉඳලා සිගරට් බොනවනේ. දැන් සිගරට් බොන එක නැවැත්තුවට වැඩක් තියෙයිද?

අනිවාර්යෙන්ම සිගරට් බොන එක නවත්තලා විනාඩි 20කින් ප්‍රතිඵල පේන්න ගන්නවා

විනාඩි 20කට පසු හෘද ස්පන්දන වේගය සහ රුධිර පීඩනය සාමාන්‍ය තත්වයට පත්වෙනවා.

පැයකට පසු සිගරට් ගඳ ඉවත්වීමට පටන් ගන්නවා.

පැය 8 කට පසු අනවශ්‍ය කාබන් මොනොක්සයිඩ් ශරීරයෙන් ඉවත් වෙනවා.

දින 5 කට පසු බහුතරයක් නිකොටින් ශරීරයෙන් ඉවත් වෙනවා.

සතියකට පසු ගඳ, සුවඳ, රස හොඳට දැනෙන්න පටන්ගන්නවා.



මාසයකට පසු නැතිවී ගිය ප්‍රසන්න පෙනුම ක්‍රමයෙන් යථාතත්වයට පත්වෙනවා.

සති 11 කට පසු පෙනහළු පිරිසිදු කරගැනීමේ හැකියාව නැවත ලැබෙනවා.

මාස 03 කට පසු පෙනහළු ක්‍රියාකාරීත්වය 30%කින් වැඩිවෙනවා.

අවුරුද්ද කට පසු හෘද රෝග, අංශභාගය, අධි රුධිර පීඩනය, මුඛ පිළිකා, පෙනහලු පිළිකා, දියවැඩියා අවදානම භාගයකින් අඩුවෙනවා.

දිනකට සිගරට් 5ක් බිපු කෙනෙක් සිගරට් බීම නවත්තලා අවුරුද්දක් අවසානයේ රු 90, 000ක් ඉතිරි කරනවා.

## සිගරට් වලින් නිදහස්වීමේ සතුට අත්විඳින්න.

කොහොමද සිගරට් වලින් නිදහස් වෙන්නේ ?
හරිම සරලයි. නවත්තනවා කියලා හිතුවා, නවත්තලා දැම්මා.
සමහර අයට එහෙම අපහසු වෙන්න පුළුවන්
ඒ අය මේ පියවර ටික අනුගමනය කරන්න

### නිදහස්වීමේ පියවර.....

**පියවර 1**

නැවැත්වීම සඳහා දිනයක් යොදා ගන්න.

**පියවර 2**

ඔබගේ තීරණය ක්‍රියාත්මක කිරීමට අන් අය සමග කතා කරන්න.

(සිගරට් බොන එක නවත්තන්න යනවා කියලා විශේෂයෙන් බිරිඳට, පෙම්වතියට සහ දරුවන්ට සහ යහළුවන්ට කියන්න.)

**පියවර 3**

ඉදිරියේදී ඇතිවිය හැකි ගැටළු ගැන සිතන්න.

- ⇨ සිගරට් බොන එක නවත්වන්න යන කොට තවමත් සිගරට් බොන අයගෙන් වෙන්න පුළුවන් බලපෑම් ගැන සිතන්න.
- ⇨ විශේෂයෙන් උත්සව අවස්ථාවල හැසිරෙන ආකාරය සැළසුම් කරන්න.
- ⇨ එහිදී කලහැකි දේවල් ගැන බිරිඳ, සිගරට් නොබොන අය සමග කතා කරන්න.
- ⇨ උපදෙස් ගන්න.
- ⇨ ඔවුන්ගේ සහයෝගය ලබා ගන්න.

**පියවර 4**

ඔබේ මෙම තීරණය දුර්වල කරන, සිගරට් බීමට බල කරන කණ්ඩායමට මුහුණ දීමට සූදානම් වන්න.

උදා:- මම සිගරට් බොන එක නැවැත්තුවා. මට බල කරන්න එපා කියලා කියන්න ආත්ම ශක්තිය හදාගන්න.

**පියවර 5**

නැවත නැවතත් සිගරට් බීමට ඔබතුල ඇතිකරන දැඩි ආශාව ගැන හිතන්න.

ඔබට නවත්වාගෙන සිටීමේ අපහසුවක් ඇතිවී සිගරට් එකක් බොන්න උනොත් ඒ ගැන පසු තැවෙන්න එපා. සිතේ දැඩි අධිෂ්ඨානයක් ඇති කර ගන්න.

**පියවර 6**

සැම විටම සිගරට් වලින් නිදහස්වීමේ සතුට අත්විඳින්න ඒ ගැන කතා කරන්න.

නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, අංක 28, ලෝරිස් පෙදෙස, ආර් ඒ ද මැල් මාවත, කොළඹ 04
(දුක - 0112599030 /යුභ දිගුව 55975 (ප්‍රධාන කාර්යාලය) 55977 (ප්‍රකාශන අංශය)




# සමාව යනු කුමක් ද





## අහිමි සරසවිය

එකට හිඳි මිතුරු කැල
ලබන විට සරසවි වරම්
නොවැටුනිද කඳුළක් නෙතින්
දුක් උනා ඇති තරම්

පරාජයේ කඳුළැල්ල
ධෛර්යය ඉවසාගෙන
සරසවි උණුසුම ලබන්නට
හැකි උනා අද දවසේ

ලබන විට සරසවි කිරුළ
ගිලිහුනු කඳුළු කැට
ඒ මං නිසා නොව
ඔබගේ ඔය වීර්යට

සෙ/319946 ලාකෝ රොෂාන් කුමාර පිපී
අණ සහ පාලන කණ්ඩායම - 24 ශ්‍රීලපාහ

කෙනෙක් ඇසුවා
"සමාව" යනු කුමක් ද ?
ඒ කුඩා පිරිමි ළමයා සුන්දර
පිළිතුරක් දුන්නා
එය පුදුම පළතුරු ගසක්,
එයට එච්චර ගල්විලින්
ගසද්දීත් අපිට ගෙඩි
ලබා දෙනවා...




25 ශ්‍රීලපාහ සෙ/331034 ලාකෝ සුරංග ආර්බීපී ගේ
ආදරණීය බිරිඳ රුවිත්‍රානි තක්ෂිලා
(අන්තර්ජාලය ඇසුරෙනි)



රටේ දියුණුව එන්න එන්න වැඩි වෙනවා
ආටි මල්ටි වෙඩි හඬ අමතක වෙනවා
රණවිරු සෙවණ අභිමංසල සොයුරන් හිනැහෙනවා
දිවිපිදූ විරුවණි ඔබ සැමදා දෙවියන් වෙනවා

රෑ දහවල් මුලතිව් කැලේ නොනිදා සිටියා
මහ වැස්ස පසු නොබලා ඉදිරියට ගියා
රට තළ කිරි ඉතිරෙන දවස බල බල හිටියා
එකී කලට ඔබ අපගෙන් වෙන්ව ගියා

සෙ/328932 සාසෙ විජේසිංහ ඊඑම්එස්
මූලස්ථානය 26 ශ්‍රීලපාහ







ඔබට දැනෙන දේ
ඔබට හැඟෙන දේ
ඔබගේ නිර්මාණයක් ලෙසින්
මෙම "සිතක සේයා"
විශේෂාංගය වෙත එවන්න

**සිතක සේයා**
වයිට් හැකල් කතෘ
වයිට්හැකල් ප්‍රකාශන ආයතනය
රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ
යුද හමුදා කඳවුර
පනාගොඩ - හෝමාගම

# රෙජිමේන්තු අධිපතිගේ 1 ශ්‍රීලපාහ සංචාරය



1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව මුල්ලියාවේලි කඳවුරේ ස්ථානගත වීමෙන් පසු රෙජිමේන්තු අධිපති තුමා 2016 ඔක්තෝබර් මස 22 වන දින ඒකකය වෙත සිය ප්‍රථම සංචාරය සිදුකරන ලද අතර එතුමන් හට යුද හමුදා සම්ප්‍රදායානුකූලව ප්‍රභූ ආචාර සම්මාන මුරයක් පිරිනැමීමෙන් අනතුරුව අභිමානයෙන් යුතුව පිළිගන්නා ලදී. ඉන් අනතුරුව ඒකකයේ අණදෙන නිලධාරී තුමන් විසින් බළඇණිය විසින් සිදුකරන වත්මන් රාජකාරී සම්බන්ධව කරුණු පැහැදිලි කරන ලදි. කඳවුරු සංචාරයෙන් අනතුරුව සියලු භට පිරිස් ඇමතු රෙජිමේන්තු අධිපති තුමා විශේෂයෙන් වසර 30 ක යුද වාතාවරණය නිමාවෙන් පසු සාමකාමී පරිසරයක් තුල රාජකාරී කටයුතු සිදුකරන ආකාරය පිලිබඳව හා සෑම විටම යුද හමුදා විනයට අනුව කටයුතු කරන ලෙස පහදා දෙමින් හරවත් දේශනයක් සිදුකරන ලදී.

එමෙන්ම සිය සංචාරය සිහිවීම පිණිස කඳවුරු භූමියේ අඹ පැළයක් රෝපණය කිරීමෙන් පසු දිවා භෝජන සංග්‍රහයකට ද සහභාගී වූ එතුමා බළඇණියේ ඉදිරි කටයුතු සාර්ථකව කරගෙන යාමට හැකිවේවායි සුභ පතමින් බළඇණියෙන් නික්ම යන ලදී.

# ආරක්ෂක සේනා මූලස්ථානය [මුලතිව්] නව ආඥාපති

## මේජර් ජෙනරල් ඩබ්ලිව්බීඩීපී ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ 1 ශ්‍රීලපාහ සංචාරයක



නවතමයෙන් පත්වූ ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ආඥාපති තුමන් එම තනතුරේ වැඩ භාරගැනීමෙන් පසු 2016 සැප්තැම්බර් මස 22 වන දින 1 ශ්‍රීලපාහ ඒකකයේ සංචාරයක නිරත විය.

කඳවුරට පැමිණි ආඥාපති තුමන්ව අණදෙන නිලධාරී තුමා ඇතුලු සියලුම නිලයින් විසින් ඉතාමත් හරසරින් යුතුව පිළිගත් අතර, කඳවුරු භූමියේ අඹ පැළයක් රෝපණය කිරීමෙන් පසු භට පිරිස් අමතා තම රාජකාරිය සාර්ථකව හා විනයගරුකව ඉටුකරන ලෙස දන්වා සමරු සටහනක් තබමින් කඳවුරෙන් නික්ම යන ලදි.

# පුනරින් ප්‍රහාරයේදී මව්බිම වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් සිහිකර පුණ්‍යානුමෝදනා පිංපෙත් පැමිණවීම



1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව යාපනය දිස්ත්‍රික්කයේ පුනරින් කඳවුරේ ස්ථානගතවී ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටින අතරතුර එනම් 1993.11.11 වන දින සිට 1993.11.14 වන දින දක්වා පුරා දින 04 ක් එම කඳවුර වෙත එල්ටීටීඊ ත්‍රස්ථවාදීන් විසින් දැවැන්ත ප්‍රහාරයක් එල්ල කරන ලදී. එම ත්‍රස්ථවාදී ප්‍රහාරය එල්ල වන විට එවකට අණදෙන නිලධාරී වශයෙන් රාජකාරි කළ දැනට විශ්‍රාම ලබා සිටින මේජර් ජෙනරල් ටීටීආර් ද සිල්වා (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී පීඑස්සී විසින් ලබාදෙන ලද නායකත්වය තුළින් එම දැවැන්ත ප්‍රහාරය මැඩපවත්වා එම කඳවුර ආරක්ෂා කර ගැනිමට හැකිවිය.

පුනරින් කඳවුර ආරක්ෂා කර ගැනිමේ සටනේදී ඒකකයට අයත් නිලධාරීන් 04 ක්, සෙසු නිලයින් 157 ක් හා සිවිල් සේවක මහතුන් 04 ක් මියගිය/අතුරුදන් වු අතර, නිලධාරීන් 05 ක්, හා සෙසු නිලයින් 138 දෙනෙකු තුවාල විය. මෙම සිදුවීම සිදුවී පළමු වර්ෂයේදීම එවකට අණදෙන නිලධාරී තුමාගේ මුලිකත්වයෙන් එම විරුවන් සිහිකරමින් වර්ෂ පූර්ණ පිංකම සිදුකර ඇති අතර, එතැන් සිට සෑම වර්ෂයක් පාසාම මෙම පිංකම නොකඩවා සිදුවිය.

ඒ අනුව 2016.11.11 දිනට මෙම ප්‍රහාරය එල්ල වී වසර 23 ක් සපිරීම නිමිත්තෙන් ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ආර්වී සමරනායක යුඑස්පී පීඑස්සී ශ්‍රීලපාහ ගේ මුලිකත්වයෙන් 2016.11.10 වන දින අනුරාධපුර ශ්‍රී මහා බෝධීන්වහන්සේ ඉදිරිපිට බෝධි පුජා පිංකමක් ද, 2016.11.11 වන දින කඳවුරට ඇතුල්වීමේ දොරටුවට ඉදිරියෙන් දිස්වන පරිදි බුද්ධ ප්‍රතිමාවක් තැන්පත් කළ අතර, 2016.11.12 වන දින උදෑසන ඉලුප්පු කන්නිය ඉසිපතනාරාමය විහාරස්ථානයේ සංඝයා වහන්සේලා හත් නමක් විෂයෙහි සාංඝික දානයක් පිරිණැමීම හා සාලියපුර මිත්‍ර ළමා නිවාසයේ වෙසෙන ළමුන් 22 නෙකු හට දිවා ආහාර පිළියෙල කොට ලබාදී එකී ප්‍රහාරයෙන් මියගිය සියලුම නිලයින් හා සිවිල් සේවක මහතුන්ට පිං අනුමෝදන් කර, තුවාල ලත් අයවලුන් හට නිරෝගි සුවය ප්‍රාර්ථනා කිරීමත් ඒකකයේ දැනට රාජකාරියේ නියුතු සියලුම නිලයින්ට හා සිවිල් සේවක මහතුන්ට ආශිර්වාද පැමිනවීමත් සිදුකරන ලදී.







# වසර 15ක් පුරන් වූ කෙත් බිමට ජීවය දුන් 4 ශ්‍රීලපාහ

53 වන අතිරේක ප්‍රහාරක සේනාංකය යටතේ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය පනාගොඩ කඳවුරේ ස්ථානගතව සිටින 4 ශ්‍රීලපාහ බළඇණිය පසුගිය කාල වකවානුව තුල කොළඹ සහ කළුතර දිස්ත්‍රික්ක තුල ඇති වූ ස්වාභාවික සහ විවිධ ආපදාවන් හි දී සිවිල් වැසියන් මුදා ගැනිමේ කාර්ය සඳහා දායකත්වය ලබා දෙමින් රාජකාරි කරනු ලබන අතර, රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සඳහා ද දායකත්වය ලබා දෙනු ලබයි. වසර 15කට ආසන්න කාලයක් පුරන්ව ගිය පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය ඉදිරිපස පිහිටි පනාගොඩ බටහිර කැකිරිදෙණිය කුඹුරු යාය වගා කිරීමේ අභියෝගය ඒකකය විසින් භාර ගත් අතර, 2016.03.02 වන දින සුබ මොහොතින් වැඩ ආරම්භ කරන ලදි. වසර මැද ඇති වූ දරුණු කුණාටු තත්වයක් යටතේ විනාශයට පත් වගාවන් උපක්‍රම ශීලීව නැවතත් සාර්ථක කර ගත් අතර, ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පි යුඑස්පි ශ්‍රීලපාහ හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ පනාගොඩ ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ නිලධාරි මහත්ම මහත්මීන්ගේ සහභාගීත්වයෙන් 2016.09.05 වන දින අස්වැන්න නෙළීම සිදු කරන ලදි. මෙම සාර්ථකත්වය යුධ හමුදා සෙබලුන්ගේ හැකියාව සහ ධෛර්‍යය සිවිල් වැසියන්ගේ හදවත් තුල පූර්වාදර්ශයක් ඇතිකිරීමට සමත් වූ අතර, අස්වැන්නෙහි ඔවුන්ගේ හිමිකම ලබා දීම තුලින් ප්‍රාදේශිය සම්බන්ධීකරණ නිලධාරීන්ගෙන් හා ප්‍රදේශවාසි ජනතාවගෙන් ඒකකයටත්, පාබල හමුදා රෙජිමේන්තුවට හා සමස්ථ යුධ හමුදාව වෙත ද කීර්තියක් අත්කරදීමට සමත් විය. වත්මන් රජය විසින් ක්‍රියාත්මක කර ඇති පුරන් කුඹුරු අස්වැද්දවීමේ ව්‍යාපෘතියට දායකත්වයක් ලබා දීම මෙහි අරමුණ වූ අතර, ශ්‍රී ලංකාවේ යුද හමුදා සෙබළුන් වන අප විසින් මෙවැනි වැඩසටහන් සිදු කිරීමෙන් රටේ භෞමික අඛණ්ඩතාවයට මෙන්ම සංහිඳියාවටද මහත් වැදගත්කමක් ගෙනදෙනු ඇත.





# 29 වන බළඇණි සංවත්සරය



පල්ලෙකැලේ ඒකක මූලස්ථානය ඉදිකොට ඇති රණවිරු ස්මාරකයට පුෂ්පෝපහාර දැක්වීම

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ පැරණි බළඇණියක් වන 5(සෙවි) බළඇණිය සිය 29 වන සංවත්සර උළෙල අභිමානවත්ව 2016.08.15 දින පල්ලේකැලේ යුධ හමුදා කඳවුරේදී පැවැත්වීය. මෙම වැඩසටහන් මාලාව ඒකකයේ අණදෙන නිලධාරී මේජර් ටීවීම්ජීආර්කේ තෙන්නකෝන් ශ්‍රීලපාහ ගේ මඟපෙන්වීම මත සිදු කරන්නට වූ අතර, ආගමික වතාවත් සහ අනෙකුත් පුණ්‍ය කටයුතු සඳහා ප්‍රමුඛත්වයක් දක්වමින් සංවිධානය කරන්නට විය.

මෙහිදී ඒකකය සමඟින් රාජකාරී කොට තිස් වසරක් පුරා පැවැති රුදුරු ත්‍රස්ථවාදය මුලිනුපුටා දැමීමේ සඳහා සිදුකරන ලද ක්‍රියාත්මක රාජකාරී වලදී දිවිපිදු සහ තුවාල ලැබූ රණවිරුවන් ද සේවයේ නියුතු සහ විශ්‍රාම ලැබූ සියලු රණවිරුවන් ද ඔවුන්ගේ පවුල්වල අයවලුන් ද සිවිල් සේවක මහතුන් ඇතුලු සියලුම දෙනා සිහිකොට පරිත්‍රාණ ධර්මදේශණයක් සිදුකල අතර, පසු දින මහා සංඝරත්නය විෂයෙහි දානමය පිංකමක් සිදුකරන්නට විය.

තවද ඒකකයේ අණදෙන නිලධාරී වෙනුවෙන් සම්මාන පෙළපාලියක් පැවැත්වූ අතර, මියගිය රණවිරුවන් සිහිකොට ඒකක මූලස්ථානයේ ඉදිකොට ඇති රණවිරු ස්මාරකයට පුෂ්පෝපහාර සිදුකරන්නට විය. එමෙන්ම මහනුවර දිගන ප්‍රදේශයේ නිකකැටිය වැඩිහිටි නිවාසය අවට ශුද්ධ පවිත්‍ර කොට එහි නේවාසිකව සිටින වැඩිහිටි දෙමාපියන් නහවා ශුද්ධ පවිත්‍ර කොට දිවා ආහාරය පිළිගන්වන ලදී. මෙය සාර්ථක කර ගැනීමට 11 සේනාංකය, 111 බළසේනාව, පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය සහ ප්‍රදේශයේ ස්ථානගත අනෙකුත් බළඇණි වෙතින් ලබාදුන් දායකත්වය මෙහිලා විශේෂයෙන් සඳහන් කරන්නෙමු.





# 7 ශ්‍රීලපාහ ඒකකයට නව පැසිපන්දු ක්‍රීඩාංගනයක්

පාබල හමුදාවට අති දක්ෂ ක්‍රීඩකයින් බිහි කිරීමේ අරමුණ පෙරටු කර ගනිමින් ඒකකයට පැසිපන්දු ක්‍රීඩා පිටියක අවශ්‍යතාවය තේරුම්ගත් අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එම්ජීඑස්පී කුලසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහගේ පූර්ණ අධීක්ෂණය හා මඟපෙන්වීම මත ඒකකයේ සියලුම නිලයින්ගේ සහයෝගය ඇතිව අංගසම්පූර්ණ පැසිපන්දු ක්‍රීඩා පිටියක් කඳවුරු භූමියේ ස්ථාපිත කරන ලදී.

නවතම්යෙන් ඉදිකරන ලද මෙම පැසිපන්දු ක්‍රීඩා පිටිය විවෘත කිරීම සඳහා අණදෙන නිලධාරී තුමන්ගේ ආරාධනයෙන් ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සපැමිණි ආරක්ෂක සේනා මූලස්ථානය කිලිනොච්චි ආඥාපති සහ ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේවීඩීවී කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ සුරතින් 2016.10.18 දින සුබ මොහොතින් විවෘත කරන ලදී. මෙම විවෘත කිරීමේ උත්සවය සඳහා 57වන සේනාංකයේ සේනාංකාධිපති, 571 බසේමු බළසේනාධිපති සහ ආසේමු(කිලි) යටතේ රාජකාරී කරනු ලබන බළසේනාධිපතිවරුන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ඒකක අණදෙන නිලධාරීවරුන් සහභාගී විය. මෙම උත්සවයට සමගාමීව මාස් හෝල්ලූන්ස් බියුගල් ආයතනයෙහි පූර්ණ අනුග්‍රහයෙන් යුතුව 7 ශ්‍රීලපාහ ඒකකය සහ 9



නව පැසිපන්දු ක්‍රීඩාංගනය විවෘත කිරීම

විපාරෙ ඒකකය අතර පවත්වන ලද ප්‍රදර්ශන පැසිපන්දු තරඟයෙන් 9 විපාරෙ ඒකක කණ්ඩායම පරදවා ජයග්‍රහණය හිමිකර ගැනීමට මෙම ඒකක පැසිපන්දු කීඩකයින් සමත් විය.



7 ශ්‍රීලපාහ ඒකකයේ පැසිපන්දු ක්‍රීඩා කණ්ඩායම



# බළඇණි ඉතිහාස පොත එළිදක්වයි

වසර 24 ක පෞඪ ඉතිහාසයකට උරුමකම් කියන 7 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව තම 24 වන ජන්ම දිනයට සමගාමීව එදා මෙදා තුර ඒකකය ආරම්භයේ සිට සිදුවූ සුවිශේෂී සිදුවීම් ඒකරාශී කොට නිර්මාණය කරන ලද බළඇණි ඉතිහාස ග්‍රන්ථය දොරට වැඩුම 2016 නොවැම්බර් 15 වන දින සිදුකරන ලදි.

මෙම ග්‍රන්ථය එළිදැක්වීමේ ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ලංකාද්වීපයේ ඒකීයභාවය ස්වෛරීත්වය හා භෞමික අඛණ්ඩතාවය රැක ගැනීමට මෙම ඒකකයේ නිලධාරීන් හා සෙබුනිලයින් විසින් සිදු කරන ලද අතිමහත් කැපවීම මෙන්ම ශ්‍රී ලංකාද්වීපයට තිරසාර සාමය උදාකරලීම වෙනුවෙන් සහ දිනාගත් නිදහස් සාමකාමී පරිසරය තවදුරටත් ආරක්‍ෂාකර ගැනීමට බළඇණියක් ලෙස සිදුකළා වූ කාර්යයභාරයන් මතු පරපුරට දැන ගැනීම සඳහා ග්‍රන්ථයක් ලෙස එළිදැක්වීමයි.

මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආසේමු (කිලි) ආඥාපති හා ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේවීඩීඒ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියු පීඑස්සී සහභාගී වන ලදි. තවද රෙජිමේන්තු මධ්‍යස්ථානය නියෝජනය කරමින් සේනාවිධායක තුමා, නියෝජ්‍ය සේනාවිධායක තුමා ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා ආසේමු (කිලි) බ්‍රිගේඩියර් (ප්‍රමාන), 57 සේනාංකාධිපති, 571 බළසේනාධිපති ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා ඒකකයට අයත් විශ්‍රාම නිලධාරීන් ද සහභාගී විය. එසේම ඒකකය ආරම්භයේ සිට මේ දක්වා අණදෙන නිලධාරිවරුන් 09 දෙනකු අතුරින් මියගිය අණදෙන නිලධාරියෙකු වන ලුතිතන් කර්නල් ඊඒපී සුපිව ආර්එස්පී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මැතිණිය හා දූ දරුවන් ද සහභාගි විය.

මෙම උත්සවයට සමගාමීව අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එම්පීඑස්පි කුලසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ අධීක්‍ෂණය යටතේ වායු සමනය කර නවීන අංගෝපාංගයන්ගෙන් සමන්විතව නවතමයෙන් ඉදි වූ නිලධාරි නිවස්නය ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති තුමන්ගේ සුරතින් විවෘත කළ අතර, ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ බළප්‍රදේශයේ සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ සුහද හමුවක් පවත්වා සහභාගී වූ සියලුම නිලධාරීන් හට විශේෂ සමරු තිලිණ ද ප්‍රදානය කරන ලදි.



නව නිලධාරි නිවස්නය විවෘත කිරීම





# 24 වන බළඇණි දින සංවත්සරය

2016.11.20 වන දින අණදෙන නිලධාරි තුමන් හට සම්මාන මුරයක් සහ සම්මාන පෙළපාලියක් ද ලබාදීමෙන් පසු අණදෙන නිලධාරි තුමන් විසින් නිලධාරි/සෙසුනිළයින් අමතන ලදී. එහිදී අණදෙන නිලධාරි තුමන් අදහස් දක්වමින් පවසා සිටියේ තමන් උපන් දේශයේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය ආරක්‍ෂා කරමින් ත්‍රස්ථවාදී ක්‍රියාකාරකම් වළකාලන්නට ඒකකයේ රණවිරුවන් අප්‍රමාණ උත්සාහයක් ගත් බවයි. එහිදී තම තමන්ගේ පුද්ගලිකත්වය පසෙකලා සිදුකලා වූ කැපවීම් තුලින් අද අපගේ දූ දරුවන් හට යහපත් හෙට දවසක් නිර්මාණය වී ඇති බව පැහැදිලි කරමින් මෙවන් සාමකාමී පරිසරයක 24 වන බළඇණි දිනය සමරන්නට හැකිවීම භාග්‍යයක් කොට සලකන බව අණදෙන නිලධාරී තුමන් විසින් හට පිරිස් අමතමින් පැවසීය.

ඒකකය සමඟ රාජකාරි කර යුද්ධයේ දී රට වෙනුවෙන් දිවිපිදූ වීරෝධාර රණවිරුවන් සිහිපත් කරමින් කඳවුරු භූමියේ ඉදිකර ඇති රණවිරු ස්මාරකය අභියසදී මල් කළඹක් තැන්පත් කිරීම අණදෙන නිලධාරි, දෙවන අණදෙන නිලධාරි සහ රෙජිමේන්තු සැරයන් මේජර් තුමන් අතින් සිදුකල අතර, 24 වන බළඇණි දිනය සිහිකිරීම වස් කඳවුරු භූමිය තුල අඹ පැළයක් රෝපණය කරන ලදි.

එදින රාත්‍රියෙහි ඒකකයේ රාජකාරි කර විශ්‍රාම ගිය ජ්‍යෙකොනොනින් හා රෙම ශ්‍රිලපාහ රෙසැමේ වෙනුවෙන් බලලත් නිලධාරි සහ සැරයන් නිවස්නයේ






සියලුම සාමාජිකයින් විසින් සුහද හමුවක් පැවැත්වූ අතර, එහිදී විශ්‍රාම ලත් ජ්‍යෙකොනොනින් සඳහා සමරු තිළිණ ප්‍රදානය කිරීම ද රෙජිමේන්තු සැරයන් මේජර් විසින් බලලත් නිලධාරි සහ සැරයන් නිවස්නය වෙත සමරු තිළිණයක් ප්‍රදානය කිරීම ද සිදුකරන ලදි. එසේම එදින රාත්‍රිය "SEVEN BEAT" සංගීත කණ්ඩායමේ මියුරු සත්සර රාවයෙන් වර්ණවත් විය.



# ඉන්දියාවේ පැවති කණිෂ්ඨ සංග්‍රාමික නායකත්ව පාඨමාලාවේ දක්ෂතම ශිෂ්‍යයා

## සෙ/318507 සැරයන් ජයවර්ධන පීඒබීයූකේ





2016.08.22 දින සිට 2016.10.29 දින දක්වා ඉන්දියාවේ බටහිර බෙංගාල ප්‍රදේශයේ කොමිෂන් නොලත් නිලධාරීන්ගේ පුහුණු පාසල බිනාගුරි හිදී පැවති කණිෂ්ඨ සංග්‍රාමික නායකත්ව පාඨමාලා අංක 25 සඳහා මෙම රෙජිම වෙතින් 8 ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/318507 සැරයන් ජයවර්ධන පීඒබීයූකේ යන ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරි සහභාගී වන ලදී. ඔහු විසින් එම පාඨමාලාව සාර්ථකව හදාරා ඊට සහභාගි වූ විදේශිය ශිෂ්‍යයින් අතරින් දක්ෂතම ශිෂ්‍යයාට හිමි සම්මානය හිමි කරගැනීමට සමත් විය. මෙම ජයග්‍රහණය ශ්‍රීලපාහ රෙජිමේන්තුවට සහ සමස්ථ යුධ හමුදාවටත් අත්කර දුන් ජයග්‍රහණයක් වන බැවින් එම ජ්‍යෙකොනොනි හට රෙජිමේන්තු අධිපති තුමන් ප්‍රමුඛ ශ්‍රී ලංකා පාබල හමුදා සියලුම නිලයින්ගේ උණුසුම් සුභ පැතුම් හිමි වන අතර, ඉදිරියේදී මෙවැනි දේශීය හා විදේශීය පාඨමාලා හැදෑරීමටත් එම පාඨමාලා තුලින් ජයග්‍රහණ හිමිකර ගැනීමටත් ඔහුට ශක්තිය හා ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

# නව සේනාංකාධිපති තුමන්ගේ ඒකක සංචාරය



14 වන සේනාංකයේ සේනාංකාධිපති ගැමුණු හේවා රෙජිමේන්තුවට අයත් මේජර් ජෙනරාල් කේපීඒ ජයසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පි යූඑස්පි එන්ඩීයූ පීඑස්සි 2016.11.04 වන දින 8 වන ශ්‍රී ලංකා පාබල හමුදා ඒකකයේ නිරීක්ෂණ චාරිකාවක නිරත විය. ඒකකයට පැමිණි සේනාංකාධිපති තුමා වෙත සම්ප්‍රදායානුකූලව කඳවුරු සම්මාන මුරයක් පිරිනමා ඒකක අණදෙන නිලධාරි විසින් පිලිගන්නා ලදි.

අනතුරුව අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එල්එච්සීආර් සිරිවර්ධන ආර්එස්පි ශ්‍රීලපාහ විසින් ඒකකය වෙතින් සිදුකරනු ලබන රාජකාරි, ප්‍රජා සත්කාර සේවාවන් හා විවිධ ව්‍යාපෘතින් පිළිබඳ දැනුවත් කිරීමෙන් පසු සේනාංකාධිපති තුමා විසින් මෙම ඒකකයේ සියලුම නිලයින් ඇමතු අතර, නිලධාරි නිවස්නයේ සූදානම් කර තිබූ තේ පැන් සංග්‍රහය භුක්ති විඳීමෙන් අනතුරුව සමරු පොතෙහි තම අත්සන සනිටුහන් කළ එතුමන් කඳවුරු පරිශ්‍රයෙන් නික්ම යන ලදි.



# 23 වන සංවත්සරය

## අභිමානයෙන් සැමරූ 9 (සෙව්) ශ්‍රීලපාහ




ශ්‍රී ලංකා පාබල හමුදාවේ 9 වන සාමාජිකයා ලෙසින් 1993 නොවැම්බර් මස 01 වන දින යාපනය අර්ධද්වීපයේ මයිලඩි ප්‍රදේශයේදී පිහිටුවන ලද 9 වන (සෙව්) පාබල හමුදාව කීර්තිමත් බළ ඇණියක් ලෙසින් දේශය වෙනුවෙන් අත්කරදුන් ජයග්‍රහණ පිළිබඳව ඇතිවන්නේ නිහතමානි වූ ආඩම්බරයකි. ඒකකයේ නියමුවන් ලෙසින් කටයුතු කල අණදෙන නිලධාරීවරුන් නව දෙනෙකුගේ මඟ පෙන්වීම යටතේ ඔවුන් විසින් ඉටුකලා වූ කාර්යභාරය මෙම සුවිශේෂී දිනයේදී සිහිපත් කරනුයේ හද පිරි සතුටිනි. යාපනය අර්ධද්වීපයේ නොයෙකුත් ප්‍රදේශවල ස්ථානගතව පුරා වසර 17 කට ආසන්න කාලයක් ත්‍රස්ථවාදීන්ගේ විනාශකාරී ක්‍රියාවන්ට නොබියව මුහුණ දුන් මෙම බළඇණිය යුද්ධය නිමාවත් සමඟ වන්නි බළප්‍රදේශයේ ඇතාවැටුණුවැව ප්‍රදේශයේ ස්ථානගත වෙමින් යුද්ධයෙන් විනාශයට පත් ගම්මාන, වෙහෙර විහාරස්ථානයන් යලි නඟාසිටුවමින් සංවර්ධන සංග්‍රාමයට පුරා වසර 05 කට අධික කාලයක් උරදුන් පසු 2016.10.03 වන දින කොළඹ ප්‍රදේශයේ ස්ථානගත විය.

23 වන සංවත්සරය සැමරීම නිමිතිකොට ගෙන මේජර් වීඩී ගුණරත්න ආර්වීස්පී ශ්‍රීලපාහ අණදෙන නිලධාරී හට නිලධාරීන් 06දෙනෙකු හා සෙසුනිළයින් 88දෙනෙකුගෙන් සමන්විත සම්මාන පෙළපාලියක් පිරිනමන ලදි. මෙම සංවත්සර වැඩසටහනට සමගාමීව අණදෙන නිලධාරී තුමන්ගේ සුරතින් පැළයක් රෝපණය කිරීම, සියලුම නිලයින් හට තේ පැන් සංග්‍රහයක් හා දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම, වොලිබෝල් අවසන් තරඟය පැවැත්වීම සිදුවිය. යුද්ධයේදී මියගිය සහ අතුරුදන් වූ ඒකකයේ නිලධාරීන් සහ සෙසු නිලයින්ට හා 2004.12.26 වන දින සුනාමි රළ පහරට හසුව මියගිය සහ අතුරුදන් වූ සියලුම සෙසුනිලයින්ට පිං අනුමෝදනා කිරීම මෙන්ම අබාධිත තත්වයට පත් සියලු අයවලුන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීම සහ දැනට ඒකකයේ රාජකාරියේ නියුතු සියලුම නිලයින්ට සහ සිවිල් සේවක මහතුන් හට සෙත් පතා එදින සවස කැළණිය රාජමහා විහාරස්ථානයේදී බෝධිපූජාමය පිංකමක් සිදු කරන ලදි. වසර 23ක් සපිරෙන 9 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරී තුමන් ප්‍රමුඛ සියලුම නිලයින් හට ඔවුගේ ඉදිරිගමන සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වන්නට ශක්තිය හා ධෛර්යය ලැබේවායි අප ප්‍රාර්ථනා කරමු.



# 9 වන බළඇණි සංවත්සරය



වර්ෂ 2007 ක් වූ දෙසැම්බර් මස 03 වන දින ප්‍රතිස්ථාපනය කරන ලද 12 ශ්‍රීලපාහ ඒකකය ශ්‍රී ලංකා පාබල හමුදාවේ රණකාමී පාබල ඒකකයක් වශයෙන් 9 වන සංවත්සරය සමරනු ලබන්නේ ඉමහත් අභිමානයෙනි. 12 ශ්‍රීලපාහ ඒකකයේ වත්මන් අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එච්එච්එස්පීඑස් ද සිල්වා ආර්එස්පී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ප්‍රධානත්වයෙන් සහ ඒකකයේ සියලුම නිලධාරී සහ සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් යුතුව සමාජ සත්කාර සහ පුණ්‍ය කටයුතු මුල්කර ගනිමින් වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කල බැව් අභිමානයෙන් යුතුව සිහිපත් කරන්නෙමු.

2016.12.01 වන දින චාරිත්‍රානුකූලව ඒකකය වෙත මහා සංඝරත්නය වඩමවා ඒකකය වෙනුවෙන් රාජකාරී කරමින් සිටියදී රට ජාතිය වෙනුවෙන් තම අගනා ජීවිත පරිත්‍යාග කළ වීරෝධාර අතීත රණවිරුවන් හා රණකෂිතයට පත් රණවිරුවන් මෙන්ම දැනට රාජකාරියේ නියුතු සෙබලුන්ටත් සිවිල් සේවක මහතුන්ටත්, ඔවුන්ගේ පවුල්වල සියලුම සාමාජිකයින්ට ද සෙත් පතා සුමදුර ධර්ම දේශණාවක් පැවැත්වූ අතර, පසුව මහා සංඝරත්නය විෂයෙහි අටපිරිකර පූජාකර මුලතිව් වට්ටප්පලෙයි අම්මාන් කෝවිලේදී ආශිර්වාද පතා දේව පූජාවක්ද පවත්වන ලදි.



2016.12.03 වන දින ඒකක අණදෙන නිලධාරී තුමන් හට සම්මාන මුරයක් පිරිනමන ලදි. අණදෙන නිලධාරී තුමන් විසින් සියලු නිලයන් අමතන ලද අතර, මනා පුහුණුව හා විනයගරුකත්වය තුලින් ලබාගත් අතීත විජයග්‍රහණයන් රැකගනු වස් හමුදාවේ කීර්තියත් ඒකකයේ අභිවෘද්ධියත් උදෙසා සියලු දෙනා කැපවී ඉදිරියටත් කටයුතු කරන ලෙස අවධාරණය කරන ලදි.
තවද, බළඇණි සංවත්සරය නිමිත්තෙන් ලේ දන්දීමේ කඳවුරක් සංවිධානය කර තිබූ අතර, වැඩසටහන් අවසානයේ සියලු නිලයින් සඳහා දිවා භෝජන සංග්‍රහයක් ඒකක අණදෙන නිලධාරි තුමාගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි. පුරා වසර 9 ක් තුළ විවිධ රාජකාරි මධ්‍යයේ සාර්ථක ගමනක් පැමිණි අප ඒකකයේ ඉදිරි ගමන සාර්ථකත්වයට පත්වීමට අවැසි ශක්තිය හා ධෛර්යය අණදෙන නිලධාරි තුමා ඇතුළු සියලු නිලයින් හට ලැබේවායැයි ඉතසිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.





# නව නියමුවාණන්ගේ සම්ප්‍රාප්තිය

වර්ෂ 2016 ක්වූ සැප්තැම්බර් මස 19 වන දින ලුතිතන් කර්නල් එච්කේජේයු ජයරත්න ශ්‍රීලපාහ 15 ශ්‍රීලපාහ ඒකකයේ නව අණදෙන නිලධාරි ධූරයේ රාජකාරි භාරගත් අතර, නව අණදෙන නිලධාරි තුමන් වෙත පිරිනමන ලද සම්මාන පෙළපාලියෙන් පසුව සම්ප්‍රදානුකූලව පොල් තෙල් පහන දල්වා සුබ මොහොතින් නව තනතුරෙහි රාජකාරී භාර ගන්නා ලදී. රාජකාරී භාරගැනිමෙන් පසු බලඇණි මූලස්ථාන කඳවුරු භූමියේ අඹ පැලයක් රෝපණය කළ අතර, ඒකකයේ රාජකාරියෙහි නියතු සියලුම නිලයින් අමතා සියලුම දෙනාගේ විනය ඉතා උසස් මට්ටමක පවත්වාගෙන යාමට ක්‍රියා කල යුතු බවත්, ඒකකය ආරම්භයේ සිට මේ දක්වා ඒකකයේ උන්නතිය වෙනුවෙන් කැපවෙමින් වසර 8 ක් වැනි කෙටි කාලයක් තුල ඒකකය හිමි කරගෙන ඇති කීර්තිනාමය ඉදිරියටත් එලෙසින්ම රැකගැනිමට ක්‍රියා කිරීම ඒකකයේ සියළුම දෙනාගේ වගකීම බව පෙන්වා දෙන ලදී.

23 වසරකට ආසන්න කාලයක් පුරා දිවයිනේ උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි ක්‍රියාන්විත රාජකාරිවල නියැලෙමින් විවිධ තනතුරු හොබවමින් සිය නායකත්වය මැනවින් පිළිබිඹු කර ඇති මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි 15 ශ්‍රීලපාහ ඒකකය පාබල හමුදා රෙජිමේන්තුව තුල ද 22 වන සේනාංක බළප්‍රදේශය තුල ද දිදුළන ඒකකයක් බවට පත් කිරීමට අවශ්‍ය ශක්තිය, ධෛර්යය හා ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.





# නික්ම යන අණදෙන නිලධාරී තුමණි ඔබටයි අපගේ උත්තමාචාරය



2013 මැයි මස 16 වන දින සූරංගල් කඳවුරේදී ඒකකයේ හතරවන නියමුවාණන් ලෙසින් වැඩ භාරගත් ලුතිතන් කර්නල් එන්පිකේ ගුණසේන ආර්ඩබ්ලිව්පි ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරි වසර තුනක පමණ කාලයක් අණදෙන නිලධාරී ධූරයේ රාජකාරි හොබවමින් ශ්‍රීලපාහ ඒකකයන් අතර මෙන්ම 22 වන සේනාංක මුලස්ථානය යටතේ ස්ථානගත ඒකකයන් අතර, 15 ශ්‍රීලපාහ නාමය ඉහලට ඔසවා තබන්නට හා ත්‍රිකුණාමලය ප්‍රදේශයේ සර්වාගමික නායකයින්, රාජ්‍ය නිලධාරින් සමඟ සම්බන්ධතාවයෙන් යුතුව සිංහල ද්‍රවිඩ හා මුස්ලිම් වැසියන් උදෙසා සිවිල් සම්බන්ධීකරණ කටයුතු ක්‍රියාවට නැංවීම සඳහා ද නායකත්වය ලබාදුන් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකි.

ඒකකය වෙනුවෙන් ඉතා විශාල කැපකිරීමක් සිදුකල ලුතිතන් කර්නල් එන්පිකේ ගුණසේන ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ නික්ම යාම වෙනුවෙන් 2016.08.06 වන දින තඹලගමුව 15 ශ්‍රීලපාහ කඳවුරු භූමියේදී සම්මාන පෙළපාලියක් පිරිනමා ඒකකයේ සියලුම නිලයින්ගේ උත්තමාචාරය පුදකරන ලදී.

# 7 වන ජන්ම දිනය අභිමානයෙන් සමරයි





ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවට තවත් සුවිශේෂී මතක සටහනක් එක් කරමින් වර්ෂ 2009 ක් වූ සැප්තැම්බර් මස 25 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 24 වන බළඇණිය ලෙස ස්ථාපිතව සිය ජාතික මෙහෙවර ඉටු කිරීමේ ගමන ආරම්භ කරන ලදි. ඒකකය මෙහෙයවන වත්මන් අණදෙන නිලධාරී වන නි/62610 ලුතිතන් කර්නල් බීවීවීම්සී බෙලිගස්වත්ත ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ මඟපෙන්වීම යටතේ දැනට මෙම බලඇණිය පුදුක්කුලම් ප්‍රදේශයේ ස්ථානගතවී ඇත. පුරා වසර 7 ක් වැනි කෙටි කාලයක් තුලදී ඒකකය ගොඩනැගීම උදෙසා කැපවීමෙන් යුතුව තම බුද්ධිය හා දායකත්වය ලබාදෙමින් රාජකාරි කරනු ලබන නිලධාරි, ජ්‍යෙකොනොනින් හා සෙසුනිලයින්ගෙන් සමන්විත මෙම ඒකකය 2016.09.25 වන දිනට යෙදී ඇති තම 7 වන ජන්ම දිනය වෙනුවෙන් ඒකක අණදෙන නිලධාරී තුමන් වෙත සම්මාන පෙලපාලියක් පිරිනැමීමත් සමගින් ආරම්භකරන ලද එම උත්සවයේ ආගමික වතාවත් වලට මුල් තැන දෙමින් යුද්ධයේදි මියගිය රණවිරුවන් හට නිවන්සුව ප්‍රාර්ථනා කර ආබාධිත රුණවිරුවන් හට ඉක්මන් සුවය පතා උත්සව මාලාව ආරම්භ කරන ලදි. තවද අණදෙන නිලධාරී තුමා සියලු නිලයන් ඇමතිමෙන් පසු කඳවුරු භූමියේ අඹ පැළයක් රෝපණය කිරීමෙන් අනතුරුව සියළු නිල දිවා භෝජන සංග්‍රහයට සහභාගී වන ලදි. පාබල මෑණියන් තුරුලෙහි හිඳ තම කීර්තිනාමය බබළවන්නට අණදෙන නිලධාරී තුමන් ඇතුළු සියළුම නිලයින් හට අවැසි ශක්තිය ධෛර්ය සහ ත්‍රිවිධ රත්නයෙහි පිහිට ආරක්ෂාව නොඅඩුව ලැබේවායි අප ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.

# 26 ශ්‍රීලපාහ නව අණදෙන නිලධාරිගේ සම්ප්‍රාප්තිය



2016 ජුලි මස 11 වන දින 26 ශ්‍රීලපාහ ඒකක නව අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි භාරගන්නා ලද නි/63487 මේජර් ඕවන් මානගේ ආර්එස්පි ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් වෙත සම්මාන පෙළපාලියක් ලබා දෙමින් ගෞරවයෙන් යුතුව පිළිගත් අතර, එදින 1046 පැයට යෙදුන සුබ මොහොතින් ආගමික වාතාවත් සිදුකොට සාම්ප්‍රදානුකූලව පොල් තෙල් පහන දල්වා රාජකාරි භාරගැනීම සිදු කරන ලදි. ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුව තුල 26 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව දීප්තිමත් බළඇණියක් බවට පත් කිරීමට අවැසි ශක්තිය ධෛර්‍යය ඔබ තුමන් හට නිරතුරුව ලැබේවායි අප ඉත සිතින් ප්‍රාර්ථනා කර සිටින්නෙමු.

# බළඇණි පුහුණුවීම් සාර්ථකව නිමකරයි

"පුහුණුවේදී දහඩිය හෙලන්නා යුධ බිමේදී රුධිරය නොහෙලයි" යන අරමුණින් ඒකක අණදෙන නිලධාරි මේජර් ඕවන් මානගේ ආර්එස්පී ශ්‍රීලපාහ යන නිලධාරිගේ පූර්ණ මෙහෙයවීම යටතේ බළඇණි පුහුණුවීම් 2016.08.22 දින සිට 2016.10.14 දින දක්වා 61 සේනාංක පුහුණු පාසල පම්පෙමඩු හිදී සාර්ථකව නිම කරන ලද අතර මෙම බලඇණි පුහුණු පාඨමාලාව සඳහා නිලධාරි 14 සහ සෙසුනිළයින් 340 දෙනෙකු සහභාගි විය. මෙම පාඨමාලාවේදී දක්‍ෂතම කණ්ඩායම ලෙස "සි" කණ්ඩායම නම් කරන ලදි.



දක්‍ෂතම සෙබලා සෙ/318632 සැරයන් සමන්ත බංඩාර ටීඑම්



දක්‍ෂතම වෙඩික්කරු නි/69364 ලුතිතන් කේබීවීඑස්වීවී බංඩාර ශ්‍රීලපාහ



කාර්යශූර සෙබලා ලෙස සෙ/310791 සැරයන් රනිල් ඩබ්එම් (ආර්ඩබ්ලිව්පී ආර්එස්පී)

# සුභ උපන්දිනයක් වේවා !



2016 සැප්තැම්බර් මස 27 වන දින
9 වන උපන්දිනය සැමරූ
2(සෙවි) ශ්‍රීලපාහ සෙ/2ඩී02795
සාසෙ වීරසිංහ ADSK ගේ
ආදරණීය පුතණුවන්

**චමෝත් මදුශංක**



2016 සැප්තැම්බර් මස 27 වන දින
4 වන උපන්දිනය සැමරූ
2(සෙවි) ශ්‍රීලපාහ සෙ/2ඩී02795
සාසෙ වීරසිංහ ADSK ගේ
ආදරණීය දියණිය

**නිමාෂි වීරසිංහ**



2016 ඔක්තෝබර් මස 10 වන දින
4 වැනි උපන්දිනය සැමරූ
රෙපිමූබ ශ්‍රීලපාහ සෙ/310536
කෝප්‍රල් රත්නායක RMD ගේ
ආදරණීය දියණිය

**හෂිණි කාවින්දි**



2016 ඔක්තෝබර් මස 10 වන දින
11 වැනි උපන්දිනය සැමරූ
15 ශ්‍රීලපාහ සෙ/327044
සාසෙ චන්ද්‍රකුමාර SHCP ගේ
ආදරණීය දියණිය

**ශශ්‍රිකා බිම්සරණි**



2016 නොවැම්බර් මස 14 වන දින
පස්වන උපන්දිනය සැමරූ
10 ශ්‍රීලපාහ සෙ/308525
කෝප්‍රල් රත්නායක KML ගේ
ආදරණීය පුතා සහ දුව

**නිමේෂ් සඳරූ**
**නිමේෂ් සඳුනි**



2016 අගෝස්තු මස 27 වන දින
5 වැනි උපන්දිනය සැමරූ
15 ශ්‍රීලපාහ සෙ/327044
සාසෙ චන්ද්‍රකුමාර SHCP ගේ
ආදරණීය පුතණුවන්

**පංබජ ජනමිතු**



2016 දෙසැම්බර් මස 22 වන දින
1 වන උපන්දිනය සැමරූ
10 ශ්‍රීලපාහ සෙ/314921
බනි II රුවන් කුමාර SA ගේ
ආදරණීය පුතණුවන්

**ලෙෂාන් ලක්නද**



2016 දෙසැම්බර් මස 30 වන දින
8 වන උපන්දිනය සැමරූ
6 ශ්‍රීලපාහ සෙ/312383
කෝප්‍රල් නිශ්ශංක YP ගේ
ආදරණීය දියණිය

**වෙනුරි අංජලා**



**නිවැරදි විසඳුම් පත් 2017 පෙබරවාරි මස 15 වන දිනට පෙර එවිය යුතුය. තරඟ කූපනය සහ කොන්දේසි මෙහි සඳහන් කර ඇත.**

## තරඟ කොන්දේසි

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරඟයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගී විය නොහැක.
3. පළමුවන, දෙවන හා තුන්වන ජයග්‍රහණ හිමිකර ගන්නා ජයග්‍රාහකයින් හට පිළිවෙළින් රු.1000/-, රු.750/-, රු.500/- වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය ලෙස සැලකේ.
5. නිවැරදි පිළිතුරු පත් අතරින් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගි ලබා දීම සිදු කෙරේ.
6. පිළිතුරු පත් එවන ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරේ **"වයිට් හැකල් ප්‍රහේලිකා අංක "67"** යනුවෙන් සඳහන් කළ යුතුයි.

*ලිපිනය : වයිට් හැකල් කර්තෘ,*
*වයිට් හැකල් ප්‍රකාශන අංශය,*
*රෙම් ශ්‍රීලපාහ, යුද්ධ හමුදා ජනපදය,*
*පනාගොඩ, හෝමාගම.*

වයිට් හැකල්

67

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 6 | 2 | | 7 | 9 | | 8 | 1 | |
| | 1 | 9 | | 3 | 8 | | 6 | 7 |
| 8 | 3 | | 2 | 6 | | 9 | 4 | |
| 3 | 9 | | 8 | 2 | | 1 | 5 | |
| | 4 | 1 | 9 | 5 | 6 | | 7 | 8 |
| 7 | 5 | | 4 | 1 | | 6 | 2 | |
| 9 | 7 | | 1 | 8 | | 4 | 3 | |
| | 8 | 3 | | 4 | 2 | | 9 | 1 |
| 1 | 6 | | 3 | 7 | | 5 | 8 | |

## ප්‍රහේලිකාව ගැන

1. කුඩා කොටු නවයකින් සමන්විත වූ විශාල කොටුවක් නිර්මාණය වී ඇති අතර එවැනි කොටු නවයකින් මෙම ප්‍රහේලිකාව සම්පූර්ණ වී ඇත.

2. කුඩා කොටු නවය තුළ 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර, එය පිළිවෙලකට අවශ්‍ය නොවේ.

3. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටු නවය සම්පූර්ණ කළ පසු 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතුය.

4. ඉහත සඳහන් පරිදි ප්‍රහේලිකාව සම්පූර්ණ කළ පසු සිරස් සහ තිරස්, හරස් අතට 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර පිළිවෙලකට අවශ්‍ය නොවේ.

5. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටුවක හා තිරස් සිරස් හා හරස් අතට එකතු වේ අගය 45 ක් විය යුතුය.

6. කුඩා කොටුවක් තුළ හෝ සිරස්, තිරස් හා හරස් අතට අංක යෙදීමේදී එකම අංකය දෙතැනක සඳහන් නොකළ යුතුයි. සඳහන් කළ හැක්කේ එක් වරකි.

**ලෝකය වෙනස් කිරීම සඳහා මායා බලයක් අවශ්‍ය නැත**



**ඒ සඳහා අවශ්‍ය බලය පමණටත් වඩා අප තුළ ගැබ් වී ඇත.**

වයිට් හැකල් 67

## කූපනය

අංකය: ..........

නිලය: ..........

නම: ..........

..........

රාජකාරි ලිපිනය : ..........

..........

..........

ඒකකය : ..........

ජාතික හැඳුනුම්පත් අංකය : ..........

යුහ හැඳුනුම්පත් අංකය : ..........

**නිවැරදි විසඳුම්පත් මෙම කූපනය සමග අප වෙත එවන්න**


# දැන්වීමයි

පාබල හමුදා සිල්වර් බියුගල්ස් සංගීත කණ්ඩායම වෙත ඉංග්‍රීසි, හින්දි, දෙමළ හා වෙනත් භාෂා වලින් ගීත ගායන හැකියාව ඇති අයවලුන් සඳහා පුරප්පාඩු ඇත. මේ සඳහා වයස අවු: 18 - 24 ත් අතර දක්ෂතාවයන් වලින් හෙබි තරුණයන්ට අයදුම් කල හැක.

වැඩි විස්තර සඳහා

තූර්ය වාදක කණ්ඩායම භාර නිලධාරි

**0771043192**




# නිවැරදි බස වහරමු

## අරුත් / නිරුත්

ඩීඑෆ් කාරියකරවන මහතාගේ අරුත් නිරුත් පොත ඇසුරිණි

### ආශිර්වාද පූජාව

සෙත්පැතීම අද ඇතැමකු විසින් වහරනු ලබන්නේ ආශිර්වාද පූජාව යනුවෙනි. ආශිර්වාද පූජාව බොදුනුවනට අයත් වුවක් නො වේ. ආශිර්වාද යනු ඉංගිරිසියෙන් Blessings යන්නයි. Bless යනුවෙන් ආශිර්වාද කිරීම දෙවියන් ගේ වැඩකි. God Bless යන්න දෙවියන් අදහන අයගේ ප්‍රාර්ථනයකි. 'දේව පිහිටයි' 'දෙවි පිහිටයි' යනුවෙන් පතන්නෝ දෙවියන් අදහන්නෝ ය. බොදුනුවනට සුදුසු ආශිර්වාද පූජාව නොව සෙත් පැතීම ය.

### ආදර්ශවත්

වැරැදියට ලියන වදන්වලින් ප්‍රකට එකක් ආදර්ශමත් යන්න. ආදර්ශ යන ශබ්දයේ අග ඇත්තේ 'අ' බැවින් එතැනට මත් යන්න යෙදිය හැකි නො වේ. එහෙයින් නිවැරැදි වන්නේ ආදර්ශවත් යන්න ම ය. උත්කෘෂ්ටමත්, උත්කර්ෂමත්, වෛශ්චර්යමත්, අලංකාරමත්, ආදර්ශමත්, අනර්ඝමත්, ප්‍රබෝධමත් යනු එසේ වැරැද්දූ වචන කීපයකි. ඒවා උත්කෘෂ්ටවත්, උත්කර්ෂවත්, වෛශ්චර්යවත්, අලංකාරවත්, ආදර්ශවත්, අනර්ඝවත් හා ප්‍රබෝධවත් යනුවෙන් නිදොස් විය යුතු ය.



# දසුනේ හසුන

ලක් දෙරණේ වැඩ හිඳිනා දළදා සම්දුන්නේ
දොහොත් මුදුන් දී වැඳ අවසර ගන්නේ
දහසක් දනන් පෙරමඟ මා පසුවන්නේ
සසරින් එතෙර වන්නයි මා මේ යන්නේ

දසුන : පුවත්පතක් ඇසුරෙන්
හසුන: ච/සැ සංජීව ඩබ්ලිව්පීයූ

# වාසනාවන් සුබ මංගලම්

## මංගල සීනු



8 ශ්‍රීලපාහ ඒකකයට අයත්
නි/69463 ලුතිතන් එස්ආර් ගිඳුරංගල ශ්‍රීලපාහ
2016.12.03 වන දින 7 කාබ ඒකකයට අයත්
නි/69468 ලුතිතන් ඩබ්ඒඩීසී කල්පනී
නිලධාරිණිය සමග
යුග දිවියට එළඹෙන ලදී.



8 ශ්‍රීලපාහ ඒකකයට අයත්
සෙ/330253 ලාකෝ ගුණවර්ධන ඒඑස්එන්
රශිකා නිරෝෂණි මෙනවිය සමඟින්
2016 සැප්තැම්බර් මස 30 වන දින
යුග දිවියට එළඹෙන ලදී.

**2016 යුද්ධ හමුදා එල්ලේ තරඟාවලියේ අනු ශූරතාවය දිනාගත්**
**පාබල හමුදා එල්ලේ ක්‍රීඩා කණ්ඩායම**

